## කාර්ය පත්‍රිකා සංග්‍රහය - 2021

# නර්තනය

## 7 ශ්‍රේණිය



නර්තන ගුරු සංසදය

කලාප අධ්‍යාපන කාර්යාලය

අම්පාර.

**07 ශ්‍රේණිය** **පටුන**


| ක්‍රියාකාරකම් අංක | ක්‍රියාකාරකම | පිටු අංකය |
|---|---|---|
| **1 වන වාරය** | | |
| 2.1 | නම්‍යතා අභ්‍යාසයේ යෙදෙමු | 01-03 |
| 1.1 | වැස්සේ අසිරිය ප්‍රදර්ශනය කරමු | 04-07 |
| 2.2 | සාම්ප්‍රදායික නර්තනයට හුරු වෙමු(පා සරඹ) | 08-11 |
| 2.3 | සාම්ප්‍රදායික නර්තනයට හුරු වෙමු(ගොඩ සරඹ) | 12-15 |
| 2.4 | බෙර හඬ මැද්දේ නටමු පද සිත් සේ | 16-19 |
| 4.1 | ජන ගායනාවල සමාජයීය හා සංස්කෘතික පසුබිම හඳුනාගනිමු | 20-21 |
| 2.5.1 | වන්නම් ගයමින් නටමු | 22-24 |
| 2.6 | බෙර පද හා ගයන ලද කවි ප්‍රස්තාර කරමු | 25-28 |
| **2 වන වාරය** | | |
| 1.3 | කුලු/ තාලම් නැටුම නිර්මාණයට එක්වෙමු | 29-31 |
| 3.2 | විකල්ප වාද්‍ය උපකරණ සකස් කරමු | 32-34 |
| 4.2 | ජන ගායනාවල සමාජයීය හා සංස්කෘතික පසුබිම හඳුනාගනිමු | 35-37 |
| 3.1 | දවුල පිළිබඳ තොරතුරු විමසමු | 38-40 |
| 2.5.2 | වන්නම ගයමින් නටමු | 41-44 |
| 5.1 | ශිල්පීය ප්‍රාගුණ්‍යය එළි දක්වන අවස්ථා ඉදිරිපත් කරමු | 45-49 |
| 6.4 | විවිධ ජනවර්ග හා සබැඳි සංස්කෘතික උත්සව අගයමු | 50-51 |
| **3 වන වාරය** | | |
| 1.2 | උත්සාහය නමැති ස්ථායි භාවය ප්‍රදර්ශනය කරමු | 52-53 |
| 4.1 | ජන ගායනාවල සමාජයීය හා සංස්කෘතික පසුබිම හඳුනාගනිමු | 54-56 |
| 5.2 | කොහොඹාකංකාරි ශාන්තිකර්මය හඳුනාගනිමු | 57-60 |
| 5.3 | නර්තන ශිල්පීන් අගයමු | 61-64 |
| 6.1 | කතරගම දේවාල පෙරහර අසිරිය පවසමු | 65-68 |
| 6.3 | කරගම් / කාවඩි නැටුම් අගයමු | 69-71 |
| 7.1 | ගීතයේ පසුබිම හඳුනාගනිමු | 72-73 |

| |
|---|
| නර්තනය<br>7 ශ්‍රේණිය. 1 - වාරය<br>ගුරුභවතාගේ නම : H.M. නදීකා ශිරෝමි අම්/සේනාගම මහ විද්‍යාලය |

නිපුණතාව : 2.0 නර්තනය හා බැඳුණු මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 2.1 ශාරීරික නම්‍යතාව සඳහා නම්‍යතා අභ්‍යාස ඉදිරිපත් කරයි.

## නම්‍යතා අභ්‍යාසයේ යෙදෙමු

## හැඳින්වීම

නර්තනයට අවශ්‍ය හැඩතල සකස් කර ගැනීම සඳහා නම්‍යතා අභ්‍යාස ඉතා වැදගත් වේ.පන්ති කාමරයේ දී නර්තන ආරම්භයට පෙර අභ්‍යාස කිරීමෙන් ඉතා හොඳ ප්‍රතිඵල ළගා කරගත හැකි ය.

**නම්‍යතා අභ්‍යාස යනු :-**

- සිරුරේ නම්‍යශීලී බව ඇති කර ගැනීමට කරනු ලබන අභ්‍යාස වේ.

## නම්‍යතා අභ්‍යාසවල නිරත වීමේ වැදගත්කම

- ශාරීරික ප්‍රසන්න බව ඇති වීම.
- රසවින්දන හැකියාව වර්ධනය වීම.
- අභියෝග වලට මුහුන දීම හා දරා ගැනීමේ හැකියාව ඇති වීම.
- කායික සංවර්ධනයක් ඇති වීම.
- මනා සෞඛ්‍ය තත්වයකින් හෙබි නිරෝගී පුද්ගලයෙකු වීම.

## 7 ශ්‍රේණියේ දී නම්‍යතා අභ්‍යාස 04 ක් ඉගෙන ගනිමු.

(1) දෙපා එක ළඟ V හැඩයට තබා සිටගෙන ඉදිරියට නැවී පොළොව ඇල්ලීම හා ඉහළට ඉස්සීම. මෙහිදී 1 2 3 4 පහතට නැමීම 5 6 7 8 ඉහළීමට එසවීම.



1 2 3 4 (පහතට නැමීම)



5 6 7 8 (ඉහළට එසවීම)

(2) කෙළින් සිට ගෙන දෑත් දෙපසට විහිදුවන්න. දකුණු අතට දකුණු කකුළ ද වම් අතට වම් කකුළ ද ළං වන සේ ඉහළට එසවීම.





(3) ඉදිරියට කකුළ හා අත අංශක 90 දිගු කොට නැවත මණ්ඩියට තැබීම දෑත් දෙපසට විහිදුවීම. (මෙය දකුණට හා වමට කරන්න.)





(4) රූප සටහනේ ආකාරයට එන දණහිසක් නමා අනිත් කකුළ දිග හැර වඩි වී දිගු කොට ඇති කකුළ දෙසට නැමීම සඳහා කෙළින් වීම.(මෙය ද දකුණට හා වමට කරන්න.)









<u>කාර්ය පත්‍රිකාව</u>

➢ පහත සඳහන් වාක්‍ය හරි නම් (√) ළකුණ ද වැරදි නම් (×) ළකුණ ද යොදන්න.

1) නර්තනය සඳහා අවශ්‍ය ශාරීරික සමබරතාව හා නිවැරදි හැඩතල නම්‍යතා අභ්‍යාස කිරීමෙන් සම්පූර්ණ වේ. ( )

2) නම්‍යතා අභ්‍යාස මනා සෞඛ්‍ය තත්වයකින් හෙබි නිරෝගී පුද්ගලයෙකු නිර්මාණය කරයි.( )

3) සතුටින් නම්‍යතා අභ්‍යාස කිරීමෙන් මානසික සුවයක් ඇති නොවේ. ( )

4) ශාරීරික ප්‍රසන්න බව ඇති වේ. ( )

5) රස වින්දන හැකියාව වර්ධනය වේ. ( )

6) අභියෝග වලට මුහුණ දීම හා දරා ගැනීමේ හැකියාව වර්ධනය වේ ( )

7) කායික සංවර්ධනයක් ඇති නොවේ. ( )

8) පුද්ගලයෙකුට තම ශරීරය නිසිලෙස පවත්වා ගෙන යාම සඳහා.................... කිරීම වැදගත් වේ.

9) නර්තනයට අවශ්‍ය සමබරතාව...................... හා ......................... හා ....................... ඉරියව් නම්‍යතා අභ්‍යාසයට උපකාරී වේ.

10) නම්‍යතා අභ්‍යාස සඳහා ඉදිරිපත් කරන චලන වර්ග ලෙස ............................ හා ..................... හැඳින්වේ.

11) ස්ථිතික චලනයකි .........................

12) නර්තනයට පෙර නම්‍යතා අභ්‍යාස කිරීමේ දී ඒ තුළින් ......................... වර්ධනය වේ.

13) නම්‍යතා අභ්‍යාස වල නිරත වීමේ වැදගත් කම පිළිබඳ කරුණු 4ක් ලියා දක්වන්න

14) දිනපතා උදෑසන සරල නම්‍යතා අභ්‍යාස කිහිපයක යෙදෙන්න.

15) දිනපතා නම්‍යතා අභ්‍යාස වල නිරත වීමේදී ඔබට හැඟුනු දේවල් ලියන්න.

නර්තනය

7 ශ්‍රේණිය. 1 - වාරය

ගුරුභවතාගේ නම : ඊ. පී. සවනි දිනේශිකා අම්/ උක්සිරිපුර විදුහල

නිපුණතාව : 1.0 පරිසර නිරීක්ෂයෙන් ලබන අත්දැකීම් ඇසුරුකර ගනිමින් නර්තන නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම :1.1 පරිසරයේ ස්වභාවිකත්වය අගයමින් විවිධ නිර්මාණ ඉදිරිපත් කරයි.

## වැස්සේ අසිරිය ප්‍රදර්ශනය කරමු.

පරිසරය යන්න අප අවට ඇති වටපිටාව ලෙස සරලව අරුත් ගැන්විය හැකිය. පරිසරයෙහි අප දකින සියල්ල සුන්දරය. චමත්කාරජනකය. නෙත සිත පිනවන හදවතට සතුටක් ප්‍රමෝදයක් ගෙන එන අපූර්වත්වයකින් යුක්තය. මිනිසාත් ස්වාභාවික පරිසරයත් අතර ඇත්තේ අවියෝජනීය බැඳිමකි. එයට හේතුව වන්නේ මිනිසා පරිසරයේ එක කොටසක් වීමයි. පරිසරය ස්වාභාවික සංසිද්ධි රැසකගේ එකතුවකි. මෙකී සියල්ල මිනිසාගේ වුවමනාව හා අවශ්‍යතා සපුරා ගැනීමට ඉවහල් වේ.

## පරිසරයේ ඇතිවන ස්වභාවික සංසිද්ධීන්


හිරු උදාව


රාත්‍රිය


වැස්ස


විදුලි කෙටීම


නියඟය


සුළං

- ❖ රිද්මය පදනම් කොට ගත් නොනවතින චලන ක්‍රියාවලියක යෙදෙන සොබාදහමේ පැවතීමද සුන්දරය. චමත්කාරජනකය. නෙත සිත පිනවන හදවතට සතුටක් ප්‍රමෝදයක් ගෙන එන අපූර්වත්වයකින් යුක්තය.
- ❖ මෙයින් එක් අවස්ථාවක් ගෙන නර්තනය නිර්මාණය කරමු.

## වැස්ස



වැස්ස යනු ස්වාභාවිකව අපට ලැබෙන්නා වු සම්පතකි. එය අසිරිමත් ලෙස සිදු වන ක්‍රියාවලියකි. වැස්ස ඇතිවන්නේ යම් ක්‍රියාවලියකට අනුවය. අතීතයේදී මුතුන් මිත්තන් වැස්ස නැමැති සංසිද්ධිය දේවත්වයෙන් පිදුබව පත පොතේ සඳහන් වේ. වැස්ස යන සංසිද්ධිය වන්දනාමානයට පාත්‍ර වීමට එක් හේතුවක් වුයේ වැස්ස ඇති කරනුයේ වැස්ස වලාහක දෙවියන් බව විශ්වාස කිරීමයි. කෘෂි ආර්ථික ක්‍රමයක් ඇති අප රටට වැස්ස අත්‍යාවශ්‍ය අංගයක් වු නිසා පුරාණයේ සිට වැස්ස ඉතාමත් සුවිශේෂ විය. වැස්ස ජන ජීවිතයට ඉතා වැදගත් මෙන්ම සමීප දෙයක්වු බව මින් පැහැදිලිය.

## වැසි දිනක් නිරික්ෂණය කරමු




❖ වැස්ස අවස්ථා තුනක් යටතේ ගොනු කරමු.

| වැස්සට පෙර | වැස්ස පවතිනවිට | වැස්සෙන් පසු |
|---|---|---|
| කළු වළාකුළු පාවීම | වැසි පොද වැටෙයි. | කුඩා දිය පහරවල් සිදී යයි. |
| පරිසරය ක්‍රමයෙන් අඳුරු වෙයි. | විදුලි කොටයි. හෙණ හඬ නැගෙයි. | කුරුල්ලන් කැදලි වලින් එලියට එයි. |
| සුළං හමයි. | වැසි ජලය ගලා යයි. | අහස පැහැදිලි වෙයි. |
| කුරුල්ලන් කැදලි වලට යයි. | කුඩ ඉහලාගෙන මිනිසුන් ගමන් කරයි. | ජලාශ පිරී යයි. |
| විදුලි කොටයි. | සුළං හමයි. | පරිසරය අලෝකමත් වෙයි. |
| ගස් සුළඟට වැනෙයි. | ළමයි කඩදාසි බෝට්ටු යවයි. | |
| අහස අලෝකමත් වෙයි. | | |

## වැසි සහිත දිනයක පරිසරයේ දක්නට ලැබෙන විවිධ වෙනස්කම්


කුඹි ගුලක් විසිරියාම


වැහිලිහිණියන් පියාඹා යාම


මෙරුන් පියැඹීම


ගෙම්බන් කෑ ගැසීම


මොණරු නැටීම

## වැස්සත් සමඟ සිදුවන ක්‍රියාවලිය තුළින් නර්තනය නිර්මාණය කරමු

- මේ සඳහා විවිධ චලනයන් භාවිත කල හැකිය. එමෙන්ම භාව නිරූපණය එක් කරගත යුතුය.



සුළං - කැරකීම හා සංචාරි චලන යොදා ගත හැකිය.

කැරකීමේදී අත් ඔසවමින් එහා මෙහා සොලවමින් කැරකීම සිදු කල හැකිය.

ජව සම්පන්නව කැරකීම ( දැඩි සුළඟකදී )

දැඩි සුළගක් දැක්වීමට රෞද්‍ර රසයෙන් භාව නිරූපණය කිරීම



අකුණු ගැසීම හෙණ හඬ - පැනීම් හා සම්බන්ධ වන්නා වූ සංචාරී චලන යොදා ගනී.

අකුණු ගැසීමකදී භයානක රසයෙන් භාව නිරූපණය කිරීම.

අකුණු ගැසීමකදී දෙකන් වැසීම



ගස් වැල් ඇඹරීම - ස්ථිතික චලන යොදා ගත හැකිය.

අත් ඔසවා චලනය කිරීම තුලින් ගසක් ප්‍රතිනිර්මාණය කළ හැකිය. මුහුණ ප්‍රසන්නව තබා ගත යුතුය.

සුළං වේගය අනුව, අත් , ඇඟිලි , කඳ චලනය වීම ද වෙනස් වේ.

ඒ අනුව මුහුණේ ඉරියව්ද අවස්ථාවට උචිත පරිදි වෙනස් වේ.( බියපත් බව හා වේදනාකාරී බව)



දෑත් චලන හා දෑත් පෙරලීමෙන් කරනු ලබන චලන යොදා ගත හැකිය.

දෑත් ලෙළවීම මඟින් වතුරේ ස්වභාවය ඉදිරිපත් කළ හැකිය.

බිම පෙරලී ජලය ගලා යාම පෙන්විය හැකිය.

## කාර්ය පත්‍රිකාව

- පහත සඳහන් ප්‍රශ්න සඳහා හරි නම්( ✓ ) ලකුණද වැරදි නම් (x) ලකුණද යොදන්න

01.පරිසරය යනු අප අවට ඇති වටපිටාවයි. ( )

02. පරිසරය හදවතට සතුටක් ගෙන දෙයි. ( )

03.වැස්ස යනු කෘතිමව අපට ලැබෙන්නා වූ සම්පතකි ( )

04. වැස්සක අසිරිය විදින්නේ සත්තු පමණි. ( )

05. වැසි වේලාවට අහස අලෝකමත්ය. ( )

06. වැසි වේලාවට සුළං හමයි. ( )

07. ගස නිර්මාණය ස්ථිතික චලනයකි ( )

08. අකුණු ගැසීමකදී සතුටක් දැනේ. ( )

- පිළිතුරු ලියන්න

01. පරිසරයේ ඇතිවන ස්වභාවික සංසිද්ධීන් 3ක් ලියන්න.

02. වැස්සට පසු පරිසරයේ දැකිය හැකි වෙනස්කම් 2ක් ලියන්න.

03. වැස්සට පෙර පරිසරයේ දැකිය හැකි වෙනස්කම් 2ක් ලියන්න.

04. වැසි දිනක සතුන් විසින් දක්වන වෙනස්කම් 2ක් ලියන්න

05.වැස්සත් සමඟ සිදුවන වෙනස්කම් 2ක් ලියන්න

06. වැස්ස පිළිබඳ කවි නිර්මාණය කරන්න

07. වැස්ස පිළිබඳ කියවෙන ගීතයක් සොයා එම ගීතයට නර්තන නිර්මාණයක් කරන්න.

නර්තනය

7 ශ්‍රේණිය. 1 - වාරය

ගුරුභවතාගේ නම : ඊ. පී. සවනි දිනේශිකා අම්/ උක්සිරිපුර විදුහල

නිපුණතාව : 2.0 නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි
.

නිපුණතා මට්ටම : 2.2 පාද චලන හුරු කරගැනීම සඳහා මූලික සරඹ ඉදිරිපත් කරයි.

## පා සරඹ

නර්තන කලාව හදාරන ආධුනික ශිල්පියාගේ පාද චලන නර්තනයට උචිත වන ආකාරයෙන් හුරුකර ගැනීම. සඳහා කරනු ලබන විශේෂ පද කොටස පා සරඹ නම් වේ. පා සරඹ හෙවත් දණ්ඩියම සරඹ ආදුනික නැටුම් ශිල්පියෙකු හදාරන මුල්ම අංගයයි. උඩරට පහතරට සබරගමු සම්ප්‍රදායන් තුනෙහිම විශේෂ නාමයන්ගෙන් මෙම සරඹ හඳුන්වයි.

**උඩරට - පාසරඹ**
**පහතරට - පා සරඹ**
**සබරගමු - මණ්ඩි පද**



### උඩරට සම්ප්‍රදාය

- පා සරඹ ගණන දොළසකි.
- සෑම සරඹයක් අවසානයේම හමාර පදය නටයි.
- පා සරඹ දොළස සඳහා එක් හමාර පදයකි.
- සරඹ 12 සඳහා විශේෂ නාමයන් ඇත.( අඩිය දැඩිය)

### පහතරට සම්ප්‍රදාය

- පා සරඹ ගණන දොළසකි
- සෑම සරඹයක් අවසානයේම හමාර පදය නටයි.
- පා සරඹ දොළස සඳහා එක් හමාර පදයකි.
- සරඹ සඳහා නාමයන් නැත( පළමු සරඹය. දෙවන සරඹය)

### සබරගමු සම්ප්‍රදාය

- පා සරඹ ගණන දොළසකි
- සෑම සරඹයක් අවසානෙයේම හමාර පදය නටයි.
- පා සරඹ දොළස සඳහා එක් හමාර පදයකි.
- සරඹ සඳහා නාමයන් නැත. ( පළමු සරඹය. දෙවන සරඹය)

### පා සරඹ නැටීමේ වැදගත්කම

- පාද හුරුකර ගැනිම
- මණ්ඩිය සකස් කර ගැනීම.
- දණහිස් දෙපසට විහිද වීම සඳහා පුහුණුව
- පාද අතර තබා ගත යුතු දුර පිළිබඳ අවබෝධය
- ශාරීරික නම්‍යතාව ඇතිකර ගැනීම.
- කඳ ඍජුව තබා ගැනීම.
- ශාරීරික නිරෝගී තාවය ඇති කිරීම.
- තාල අවබෝධය ලැබීම.

## පා සරඹ නැටීමේ දී දැකිය හැකි විශේෂ ලක්ෂණ

- පාද චලන පමණක් යොදා ගැනීම.
- පද කටින් කියා නර්තනය කිරීම.
- දණ්ඩි කද භාවිතය
- සරඹ නර්තනයේ දී බෙරය යොදා නොගනී
- තෙයි යන පදය මූලික කොට සරඹ නිර්මාණය වී ඇත.
- සරඹ පද සරල බවේ සිට සංකීර්ණ බව දක්වා ක්‍රමයෙන් වර්ධනය වීම

## සරඹ අභ්‍යාසයේදි පිළිපැදිය යුතු ගුණාංග

- නිවැරදි අංගහාර පවත්වා ගත යුතුයි.
- ලය වේගය පවත්වා ගත යුතුයි .

## පා සරඹ නර්තනය කරමු

- 6 ශ්‍රේණියේ උගත් පා සරඹ මතකයට නංවමු

| | |
|---|---|
| අඩිය | තෙයි |
| දැඩිය | තෙයි කිට තෙයි තාම් |
| තුන් අඩිය | තෙයි කිට /// තෙයි තාම් |

## 7 ශ්‍රේණියට නියමිත පාසරඹ නර්තනය කරමු.

- පහත සඳහන් පා සරඹ පද තාල තබා හඬ නඟා කියමු.(තාලම්පට වාදනය කරමින්)
- සමගුණ හා දෙගුණ යන ලය පිලිබඳ අවබෝධයෙන් සරඹ අභ්‍යාස කරමු.

**හතරවන සරඹය**

- සරඹ නාමය - සිවු අඩිය
- සරඹ පදය - තෙයිත තෙයිත තෙයි තෙයියත් තාම්
- කාලය - මැදුම් තනි තිත

| | / 1 2 3 | / 1 2 3 | / 1 2 3 | / 1 2 3 |
|---|---|---|---|---|
| විලම්භ | තෙයි - ත | තෙයි - ත | තෙයි - තෙයි | යත් තාම් - |
| මධ්‍ය | තෙයි තතෙ යිත | තෙයි තෙයියත් තාම් | තෙයි තතෙ යිත | තෙයි තෙයියත් තාම් |

**පස්වන සරඹය**

- සරඹ නාමය - දැල අඩිය
- සරඹ පදය - තෙයි ති තා තෙයි
- කාලය - මහ තනි තිත

| | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 |
|---|---|---|---|---|
| විලම්භ | තෙයි - - ති | තා - තෙයි - | තෙයි - - ති | තා - තෙයි - |
| මධ්‍ය | තෙයි ති තා තෙයි | තෙයි ති තා තෙයි | තෙයි ති තා තෙයි | තෙයි ති තා තෙයි |

**හයවන සරඹය**

- සරඹ නාමය - පසු පෙර අඩිය
- සරඹ පදය - තා තෙයියත් /// තා තෙයි
- තාලය - මැදුම් තනිතිත

| | / 1 2 3 | / 1 2 3 | / 1 2 3 | / 1 2 3 |
|---|---|---|---|---|
| විලම්භ | තා තෙයි යත් | තා තෙයි යත් | තා තෙයි යත් | තා තෙයි - |
| මධ්‍ය | තාතෙයි යත්තා තෙයියත් | තාතෙයි යත්තා තෙයි | තාතෙයි යත්තා තෙයියත් | තාතෙයි යත්තා තෙයි |

**හමාර පදය** - තෙයියත් තෙයියත් තෙයියත් තාම්
තෙයි තාම් තෙයි තෙයි තත් තත් තාම්

- තාලය - මහ තනිතිත

| / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 |
|---|---|---|---|
| තෙයි - යත් - | තෙයි - යත් - | තෙයි - යත් - | තාම් - - - |
| තෙයි - - - | තාම් - - - | තෙයි - තෙයි - | තත් - තත් - |
| තාම් | | | |

## කාර්ය පත්‍රිකාව

➢ පහත සඳහන් ප්‍රශ්න සඳහා හරි නම්( ✓ ) ලකුණද වැරදි නම් (x) ලකුණද යොදන්න

01.ආධුනික ශිල්පියා පලමුව හදාරන අංගය පා සරඹ වේ. ( )

02.පා සරඹ තෙයි යන පදය මුලික කොට නිර්මාණය වී නැත. ( )

03.පා සරඹ නර්තනයේ දී නිවැරදි අංගහාර පවත්වා ගත යුතුයි. ( )

04.පා සරඹ අභ්‍යාසයේ දී තාල හැකියාව වර්ධනය වේ. ( )

05. පා සරඹ අභ්‍යාසයේදී පද කටින් කියා නර්තනය කරයි. ( )

➢ හිස් තැනට අදාල පිළිතුර යටින් ඉරක් අඳින්න

01..............................නර්තනයේ මුලික ඉරියව්ව යි. (මණ්ඩිය / පා සරඹ)

02. පා සරඹ නර්තනය සඳහා ..................... භාවිත නොකරයි. ( ගැටබෙරය / තාලම්පට)

03.නමස්කාර පදය ............... වතාවක් සිදු කරයි. ( හතර / තුන් )

04. පා සරඹ නර්තනයේ දී ............... චලන පමණක් භාවිත කරයි. ( හස්ත / පාද)

08. අතීතයේ දී පා සරඹ නර්තනයේ දී ................. භාවිත කර ඇත. ( දණ්ඩිකඳ / මණ්ඩි පද)

05.පා සරඹ ගණන ............ .( දොළසකි / එකකි )

➢ යා කරන්න

| | |
|---|---|
| 1.පසුපෙර අඩිය | තෙයි කිට/// තෙයි තාම් |
| 2. අඩිය | තෙයි කිට තෙයි තාම් |
| 3.දැල අඩිය | තෙයිත// තෙයි තෙයියත් තාම් |
| 4.තුන් අඩිය | තෙයි ති තා තෙයි |
| - 5.සිව් අඩිය | තා තෙයියත් /// තා තෙයි |
| 6.දැඩිය | තෙයි |

➢ ලබා දී ඇති තොරතුරු අනුව පහත වගුව සම්පූර්ණ කරන්න

| සම්ප්‍රදාය | උඩරට | පහතරට | සබරගමු |
|---|---|---|---|
| සරඹ නාමය | | පා සරඹ | |
| සරඹ අවසන් කරන පදය | | | හමාර පදය<br>සරඹ 12 සඳහාම එක් හමාරයකි. |
| සරඹ ගණන | | 12 | |
| සරඹ නාමයක් ඇත / නැත | නාමයක් ඇත | | |

➢ පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න

01. නමස්කාර පදය ලියන්න.
02. මණ්ඩියේ මූලික ලක්ෂණ 2ක් ලියන්න
03. පා සරඹ අභ්‍යාසවල යෙදීමෙන් ලැබෙන ප්‍රයෝජන 3ක් ලියන්න
04. පා සරඹ නැටීමේදී දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ 2ක් ලියන්න
05. සරඹ අභ්‍යාසයේදී පිළිපැදිය යුතු ගුණාංග 2ක් ලියන්න
06. හමාර පදය ලියන්න

➢ නියමිත අංගහාර අනුගමනය කරමින් 1 සිට 6 දක්වා පා සරඹ නර්තනය කරන්න



නර්තනය

7 ශ්‍රේණිය. 1 - වාරය

ගුරුභවතාගේ නම : ඊ. පී. සවනි දිනේශිකා අම්/ උක්සිරිපුර විදුහල

නිපුණතාව : 2.0 නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 2.3 නර්තනය හා සබැඳි විධි ක්‍රම අනුගමනය කරමින් සරඹ ඉදිරිපත් කරයි.

## සාම්ප්‍රදායික නර්තනයට හස්ත පාද හුරුකර ගනිමු



- පා සරඹ නැටීමෙන් අනතුරුව ආධුනික ශිල්පියා පුගුණ කරන සරඹ ගොඩ සරඹ නම් වේ.
- ගොඩ සරඹ නැටීමේ අරමුණ වනුයේ දෑතේ හුරුව ලබාදීමයි
- අත් ගෙන නටන නිසා අත් සරඹ යයිද කියයි.
- නිශ්චිත අංගහාර හා හැඩතල පවත්වා ගැනීම නිසි ලෙස පුරුදු පුහුණුවන්නේ මෙකී සරඹ අභ්‍යාස තුලිනි.
- මෙම සරඹ ගොඩ නගා ඇත්තේ සරල බවේ සිට සංකීර්ණ බව දක්වා ක්‍රමයෙන්ම සංවර්ධනය වන ආකාරයෙනි.
- පා සරඹ සඳහා මෙන් නොව ගොඩ සරඹ සඳහා එකී සාම්ප්‍රදායට අනන්‍ය වූ බෙරය භාවිත කරයි.
- **විලම්බ, මධ්‍ය,** ලය ප්‍රභේද අනුව නර්තනයේ යෙදෙයි.

## උඩරට සම්ප්‍රදාය

ගොඩ සරඹ දොළසක් ඇත. සෑම ගොඩ සරඹයක් අවසානයේ ම එකී සරඹය සඳහා නිශ්චිත වූ කස්තිරමක් නටනු ලැබේ. කස්තිරමක් යනු පද කොටසක් අවසානයේදී නටන විශේෂ පද කොටසකි . ගොඩ සරඹ දොළස හැඳින්වීම සඳහා වෙනම නම් දොලසක් ඇත.

## පහතරට සම්ප්‍රදාය

මෙම සරඹ **ඉලංගම් සරඹ** නමින් හඳුන්වයි. සංඛ්‍යාව දොළසකි. කස්තිරම **ඉරට්ටිය** නමින් හඳුන්වයි. එක් එක් සරඹ සඳහා ඉරට්ටි දොළසකි. සරඹ හැඳින්වීමට විශේෂ නාමයක් නැත. සංඛ්‍යාත්මක නාමයෙන් හඳුන්වයි ( පළමු පදය , දෙවන පදය )

## සබරගමු සම්ප්‍රදාය

**දොඹින පද** ලෙස හඳුන්වයි. කස්තිරම **හමාර පදය** ලෙස හඳුන්වයි. සරඹ දොළසකි. සරඹ දොළස සඳහාම එක් හමාර පදයකි. සරඹ හැඳින්වීමට විශේෂ නාමයක් නැත. සංඛ්‍යාත්මක නාමයෙන් හඳුන්වයි ( පළමු පදය ,දෙවන පදය )

## 6 ශ්‍රේණිවල ගොඩ සරඹ මතකයට නංවමු.

| | සරඹ නාමය | සරඹ පදය | කස්තිරම |
|---|---|---|---|
| 6 ශ්‍රේණිය | අඩිය | දොමි කිට කිට දොමි | තත් ජිත් තොං නං තා |
| | දැඩිය | දොමි කිට කිට දොමි | තත් ජිත් තක ජිත්<br>තත් ජිත් තොං නං තා |

## 7 ශ්‍රේණියට නියමිත ගොඩ සරඹ

- පහත සඳහන් ගොඩ සරඹ පද ලය දෙකට තාල තබා හඬ නඟා කියමු.
  (තාලම්පට භාවිත කරන්න)
- සරඹ පදයට අදාල කස්තිරම තාල තබා කියමු
- සමගුණ හා දෙගුණ යන ලය පිලිබඳ අවබෝධයෙන් සරඹ අභ්‍යාස කරමු.

**3 සරඹය** - තුන් අඩිය
පදය - දොමි කිට /// කිට දොමි
කස්තිරම - ගත්තකු ජිත්තම් ගජිතකු ජිත්තම් තරිකිට ජිත්
තරිකිට දොමිකිට තා

| | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 |
|---|---|---|---|---|
| සමගුණ | දො මි කි ට | දො මි කි ට | දො මි කි ට | කි ට දො මි |
| දෙගුණ | දොමි කිට දොමි කිට | දොමි කිට කිට දොමි | දොමි කිට දොමි කිට | දොමි කිට කිට දොමි |
| කස්තිරම | ගත් - ත කු<br>තරි කිට ජිත් - | ජිත් - තම් -<br>තරි කිට දොමි කිට | ග ජි ත කු<br>තා - - - | ජිත් - තම් - |

4 සරඹය - සිව් අඩිය
පදය - දොමි කිට /// කිට දොමි
කස්තිරම - ගත්තකු ජිත්තම් ගජිතකු ජිත්තම්
ගජිං ජිංත කුද ගජිතකු ජිත්තම්
තරිකිට ජිත් තරිකිට දොමිකිට තා

| | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 |
|---|---|---|---|---|
| සමගුණ | දො මි කි ට | දො මි කි ට | දො මි කි ට | කි ට දො මි |
| දෙගුණ | දොමි කිට දොමි කිට | දොමි කිට කිට දොමි | දොමි කිට දොමි කිට | දොමි කිට කිට දොමි |
| කස්තිරම | ගත් - ත කු<br>ග ජිං - ජිං<br>තරි කිට ජිත් - | ජිත් - තම් -<br>- ත කු ද<br>තරි කිට දොමි කිට | ග ජි ත කු<br>ග ජි ත කු<br>තා - - - | ජිත් - තම් -<br>ජිත් - තම් - |

කාර්ය පත්‍රිකාව

➢ සරඹ නාමය පිළිවෙළට සැකසීම සඳහා අදාල අංකය ඉදිරියෙන් ඇති කොටුවෙහි යොදන්න

- දෑඩිය
- සිව් අඩිය
- අඩිය
- තුන් අඩිය

➢ වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න.

( දැතේ හුරුව , දවුල , පා සරඹ , හමාරපදය , අත් සරඹ , ගොඩ සරඹ, කස්තිරමක් , පාද හුරුව , අඩව්ව , බෙරය )

01. පා සරඹ නැටීමෙන් අනතුරුව ආධුනික ශිල්පියා.................ප්‍රගුණ කරයි.

02. ගොඩ සරඹ නැටීමේ අරමුණ වනුයේ..................... ........... ලබාදීමයි.

03. අත් ගෙන නටන නිසා................................................... ලෙස හඳුන්වයි.

04. පද කොටසක් අවසානයේ දී නටන විශේෂ පද කොටස.................... වේ.

05. ගොඩ සරඹ නර්තනය සඳහා .......................................... භාවිත කරයි.

➢ පහත ප්‍රශ්න සඳහා අදාල පිළිතුරු ඉදිරියෙන් ලියන්න.

01. නර්තනයේ මූලික අංගහාරය....................... ( දණ්ඩිය / මණ්ඩිය )

02. ගොඩ සරඹ ගණන ...................... ( 12 / 18 )

03. නර්තනයට පෙර පළමුවම සිදු කරයි..................... ( පා සරඹ / නමස්කාරය )

04. උඩරට නැටුමේ සරඹ ගණන. ........................ ( 12 / 02 )

05. තාල තැබීමට උචිත භාණ්ඩය.................. ( ගැටබෙරය / තාලම්පට )

06. සමගුණ ලෙස හඳුන්වන්න්....................... ( මධ්‍ය / විලම්භ )

07. සරඹ 12 සඳහාම එක් හමාරපදයකි............... ( සබරගමු සම්ප්‍රදාය / පහතරට සම්ප්‍රදාය)

08. මධ්‍ය ලය ලෙස හඳුන්වන්නේ...................... ( ද්‍රැත ලය / දෙගුණය )

09. සිව් අඩියේ කස්තිරමට සමාන කස්තිරමක් ඇත්තේ ............. ( 2 සරඹයේ / 3සරඹයේ )

10. තත් ජිත් තක ජිත් මෙසේ ආරම්භ වන්නේ .................... ( 1 සරඹයේ / 2 සරඹයේ )

➢ පහත සඳහන් කස්තිරම සම්පූර්ණ කරන්න.

ගත්තකු .................. ගජිතකු ජිත්තම්

ගජිං ජිංත කුඳ ගජිතකු .......................

තරිකිට ජිත් තරිකිට .............................

➢ පහත සඳහන් පද සම්බන්ධතාවය දැක්වෙන පරිදි යා කරන්න.

| | | |
|---|---|---|
| උඩරට | ඉලංගම් සරඹ | හමාරපදය |
| පහතරට | දොඹින පද | කස්තිරම |
| සබරගමු | ගොඩ සරඹ | ඉරට්ටිය |

➢ දොමි කිට කිට දොමි යන පදය සමගුණ හා දෙගුණයට ප්‍රස්තාර කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| සමගුණ | | | | |
| දෙගුණ | | | | |

➢ නිවැරදි පිළිතුර ඉදිරියෙන් ලියන්න

01. නමස්කාරය සිදු කරමින් පළමුව අවසර ගන්නේ .................................

02. මණ්ඩියේදී පාද අතර දුර ..................................

03. පළමු ගොඩ සරඹයේ කස්තිරම ..................................

04. තුන්වන සරඹයේ පදය ලියන්න ...................................

05. ගොඩ සරඹ නර්තනයේදී වාදනය කරන බෙරය ...................................

➢ නියමිත අංගහාර අනුව ගොඩ සරඹ නර්තනය කරන්න.



| නර්තනය | | |
|---|---|---|
| 7 ශ්‍රේණිය | I වාරය | |
| ගුරුභවතාගේ නම : | ඊ. පී. සවනි දිනේශිකා | අම්/ උක්සිරිපුර විදුහල |

නිපුණතාව : 2.0 නර්තන හා සබැඳි මුලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 2.4 සාම්ප්‍රදායික නර්තන ඇසුරෙන් අලංකාර පද (මාත්‍රා) නිර්මාණය කරයි.

## <u>බෙරහඬ මැද්දේ නටමු පද සිත් සේ</u>





පරිසරය → වර්ණ නාද චලන හැඩතල නිසා අලංකාර වේ.





මිනිසා → ඇඳුම් පැළඳුම් නිසා අලංකාර වේ.

## <u>නර්තනයක සුන්දරත්වය දැකීමට අවශ්‍ය කුමක්දැයි සොයා බලමු.</u>

- ශරීරයේ විවිධ කොටස් (අංග, උපාංග, ප්‍රත්‍යාංග) රිද්මයකටත් තාලයකටත් චලනය කිරිම නර්තනය වේ.
- නර්තනය ශරීර සෞඛ්‍යය ඉතා යහපත් ලෙස පවත්වා ගැනීමටත් ශරීරයේ හැඩය පවත්වා ගැනීමටත් උපකාරී වෙයි.
- ඔබ මීට පෙර පා සරඹ,ගොඩ සරඹ, වන්නම්, ගැමි නැටුම් හා ගීත අනුව නර්තනයේ යෙදී ඇත.
- පා සරඹ ගොඩ සරඹ යනු සාම්ප්‍රදායික නර්තනයේ මුලික පදනමයි.
- **ඔබ උගත් පා සරඹ , ගොඩ සරඹ සඳහා කැරකීම් , වාඩිවීම් , උඩ පැනීම් , විවිධ දිශා වලට ගමන් කිරීම ආදිය එක්කර නර්තන නිර්මාණය කිරීමෙන් එම නර්තනයේ රසය වැඩි කරගත හැක .**
- රසය වැඩි කරගත් නර්තන වල ඇතුලත් නර්තන පද අලංකාර මාත්‍රා ලෙස හැදින්විය හැක.
- මෙසේ ශාස්ත්‍රීය නර්තන අලංකාර කිරීමට යොදා ගනු ලබන එක් මාධ්‍යයක් ලෙස අලංකාර මාත්‍රා හැදින්විය හැක.
- වෙනත් නර්තන නිර්මාණ සඳහා ද අලංකාර මාත්‍රා භාවිත කල හැකිය.

## අලංකාර මාත්‍රා නිර්මාණය

❖ **අලංකාර මාත්‍රා නිර්මාණයේ දී අවකාශය මනාව භාවිත කල යුතුයි.**



- **අවකාශ භාවිතය යනු**

නර්තනයක දී අපට ලබා ගත හැකි ඉඩ ප්‍රමාණය හඳුනා ගැනීම හා එයින් උපරිම ප්‍රයෝජන ගැනීම වේ.

- අවකාශය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි.
  - **පුද්ගල අවකාශය**
  - **පොදු අවකාශය**

- **පුද්ගල අවකාශය** යනු නර්තනයක දී එක් පුද්ගලයකු විසින් අත්පත් කර ගන්නා ඉඩ ප්‍රමාණයයි.
- **පොදු අවකාශය** යනු නර්තනයක දී සමූහයක් විසින් අත්පත් කර ගන්නා ඉඩ ප්‍රමාණයයි.

❖ **නර්තන නිර්මාණයකදී වාඩිවීම්, උඩ පැනීම් භාවිත කරමින් අලංකාර පද නිර්මාණය.**



- නර්තනයක දී විවිධ තල භාවිතය මඟින් අලංකාර පද නිර්මාණය කල හැක.
- අවකාශයේ ශරීරය රඳවා ගනු ලබන ස්ථාන තල නම් වේ.
- චලනයක් සිදු කරන්නේ කවර හෝ තලයක් මත හිඳය.
- එම තල : **පහළ තලය**

  **මැද තලය**

  **ඉහළ තලය** නම් වේ.

## නර්තන නිර්මාණයක දී ඉදිරිපසට හා පසුපසට කැරකීම් භාවිත කරමින් අලංකාර පද නිර්මාණය



- නර්තනයක දී  පැනීම්, කැරකීම්, භාවිතය මඟින් අලංකාර පද නිර්මාණය කල හැක.
- ඉදිරියෙන්  කැරකීම, පිටුපසින්  කැරකීම, අර්ධව කැරකීම, පැත්තෙන්  කැරකීම යොදා ගනී.
- ඉදිරියට පැත්තට ඉහලට පැනීම් යොදා ගනී.

❖ **නර්තන නිර්මාණයක දී විවිධ දිශාවලට ගමන් කරමින්  අලංකාර පද නිර්මාණය**



- නර්තනයක දී විවිධ දිශා භාවිතය මඟින් අලංකාර පද නිර්මාණය කල හැක.
- චලනයක් තුලින් මතු වන්නේ කිසියම් ජ්‍යාමිතික හැඩයකි.
- චලන කිහිපයක් එක් වීම ජ්‍යාමිතික හැඩතල සමුහයකගේ සංයෝගයයි.
- මෙම හැඩතල ඒකාකාර රටාවක් ලෙස නොපවතී.
- මොහොතින් මොහොත වෙනස් වේ.
- සුන්දරත්වයක් ඇති වන්නේ මෙසේ වෙනස් වන හැඩයන් තුලිනි

➢ 6 ශ්‍රේණියේදී ඔබ මාත්‍රා 2 තිතට අලංකාර පද නිර්මාණය කරන ලදී.

➢ එම අලංකාරපද මතකයට නංවා ගනිමින් .

➢ ඉහත  උපදෙස් අනුව විවිධත්වයක් මතුවන පරිදි  7 ශ්‍රේණියට අදාල මාත්‍රා 2 + 3 තිතට අලංකාර පද නිර්මාණය කරමු.

තාලය - 12 / 123 (සුළු මැදුම් දෙතිත)

බෙර පදය - දොං ජිංත ගත දොංත

- නිර්මාණය කරගත් අලංකාර පද නිරන්තර අභ්‍යාසයේ යෙදීමෙන් ප්‍රායෝගික කුසලතාව වර්ධනය වේ.

## අලංකාර පද නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු

- සාම්ප්‍රදායික නර්තනයට හානි නොවන අයුරින් අලංකාර පද නිර්මාණය කල යුතුයි.
- සම්ප්‍රදායට ආවේනික චලන භාවිත කල යුතුයි.
- නිවැරදි අංගහාර පවත්වා ගනිමින් නර්තනය කල යුතුයි.
- අවකාශය මනාව භාවිත වන පරිදි අලංකාර මාත්‍රා නිර්මාණය කල යුතුයි.

## කාර්ය පත්‍රිකාව

- පහත සඳහන් ප්‍රශ්න සඳහා හරි නම්( ✓ ) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද යොදන්න

01. සාම්ප්‍රදායික නර්තනයට හානි වන අයුරින් අලංකාර පද නිර්මාණය කල යුතුයි. ( )

02. අලංකාර පද නිරන්තර අභ්‍යාසයේ යෙදීමෙන් ප්‍රායෝගික කුසලතාව වර්ධනය නොවේ. ( )

03. 12/123 තාලයට අයත් බෙර පදයකි දොං ජිංත ගත දොංත. ( )

04. නර්තන නිර්මාණයක දී විවිධ දිශාවලට ගමන් කරමින් අලංකාර පද නිර්මාණය කල හැක. ( )

05.නර්තනය ශරීර සෞඛ්‍යය ඉතා යහපත් ලෙස පවත්වා ගැනීමට උපකාරී නොවේ. ( )

- පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

01. නර්තනය යන්න කෙටියෙන් හඳුන්වන්න

02. නර්තනයේ දී භාවිත අවකාශයේ ප්‍රධාන කොටස් දෙක ලියන්න

03. නර්තනයකදී භාවිතයට ගන්නා තල තුන නම් කරන්න

04. අලංකාර පද නිර්මාණය සඳහා භාවිත කළ විධික්‍රම 2ක් ලියන්න

05. නිර්මාණය කර ගත් අලංකාර පද නිරන්තරයෙන් අභ්‍යාස කිරීමෙන් ලැබෙන වාසි 2ක් ලියන්න

- හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න
  (අවකාශය/ පරිසරය / අංගහාර / මූලික/ වාඩිවීම්, උඩ පැනීම් )

01. පා සරඹ ගොඩ සරඹ යනු සාම්ප්‍රදායික නර්තනයේ............................. පදනමයි

02. නර්තන නිර්මාණයක දී ...................................භාවිත කරමින් අලංකාර පද නිර්මාණය කරයි.

03. අලංකාර මාත්‍රා නිර්මාණයේ දී ................................ මනාව භාවිත කරයි.

04. වර්ණ නාද චලන හැඩතල නිසා............................ අලංකාර වේ.

05. නිවැරදි............................ පවත්වා ගනිමින් නර්තනය කල යුතුයි.

| නර්තනය | | |
|---|---|---|
| 7 ශ්‍රේණිය. | 1 - වාරය | |
| ගුරුභවතාගේ නම : Y.G.U.S. රාජපක්ෂ | | අම්/සද්ධාතිස්ස මහා විද්‍යාලය |

නිපුණතාව : 4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැදි ගායනා වල පසුබිම අධ්‍යයනය කරමින් ගායනා කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 4.1 නිර්දේශිත ගායනාවල සාමාජීය හා සංස්කෘතික පසුබිම විස්තර කරයි.

## තල මල වරුණ කවි හා බැදි සාමාජීය හා සංස්කෘතික පසුබිම

තලගස් නැතහොත් තල් ගස යනුවෙන් හැඳින්වෙන මෙම ගස අප ආස කරන පරිසරය සුන්දර කරන ගසකි. යාපනය වැනි වියළි කලාපීය ප්‍රදේශවල වැවෙන මෙම ශාකය සාමාජීය වටිනාකමක් ඇති ගසකි. මෙම ශාකයේ අවසාන කාලයේ දී (ගස මිය යන කාලය) ගස මුදුනේ තල මල නම් සුවිශේෂී වුත් ඉතා අලංකාර වූත් විශාල වූත් මලක් පිපෙයි.

පරිසරයේ චමත්කාරය වඩවන මෙම තල මල පිපීම අසුභ ලකුණක් ලෙස පැරැන්නන් හදුන්වයි. මෙම මලෙන් විහිදෙන සුවඳ මිනිසුන් වන අප හට නොදැනුනද කුඩා කෘමි සතුන්ට ඉතා ආකර්ෂණයක් ගෙන දේ. මාස 3ක් වැනි කාලයක් පිපී තිබෙන මෙම මල පරවීමට ආසන්න වන විට මෙහි පදිංචිව සිටි කුඩා කෘමින් වෙනත් ප්‍රදේශ වල පිහිටි බව බෝග කරා ඇදී යාමත් සමඟ එම වගාවන් විනාශයට පත් වීමත් මෙම ගසේ බීජ හැලීමට ප්‍රථම මල කපා ඉවත් නොකිරීමත් හේතුවෙන් එම බීජ විසිරී ගොවි බිම් පාලු කර පස නිසරු වීම යන ජෛව විද්‍යාත්මක හේතු නොදත් පැරණි ගැමියන් තල මල පිපීම අසුභ සංකේතයක් ලෙස සැලකීය.





තල මලක් පිපීමට වසර 100 ගත වන බවත් තල මල පිපී බීජ විසිරීමට ප්‍රථම මල කපා ගෞරව කිරීමක් ලෙස ඇතු පිටින් ගමින් පිටතට රැගෙන ගොස් ඇති බවත් එහිදී මෙම තල මල කවි ගායනා කල බවත් සඳහන් වේ.

කෙසේ වෙතත් තල මලෙහි ඇති සුන්දරත්වයත් එහි ඇති මහේශාක්‍ය පෙනුමත් , මුළු ගමටම දිස් වන පරිදි ඉතා උසකින් පිපීමත් නිසා ජන කවියෝ එහි සුන්දරත්වය කවියට එක් කරන ලදී.

තල මල කවි ගායනයේ අන්තර්ගතය දෙස බලන විට තල මල මුතු කුඩයක් ලෙසත් , ඔටුන්නකටත් සමාන කර ඇති බව කවි ගායනාවලින් ප්‍රකට වේ.

උදා: ලෙල දෙමිනේ මල උඩුගුවනේ මුතු කුඩ

ලෙසිනේ ඈතට පෙනුනේ................

අද්‍යතනයේ තලමල කවි යොදා ගනිමින් තල මල වර්ණනා ඇතුලත් නර්තන අංග ද නිර්මාණය කර ඇත.

## තල මල වරුණ කවි ගායනා

තාල රූපය : 3 + 4

බෙර පදය : දොං ජිං ජිං තකට දොං තක

| | | | |
|---|---|---|---|
| ලෙළ දෙමිනේ මල උඩු | ගුවනේ | | |
| | | මුතු කුඩ ලෙසිනේ සුළඟට | වැනුනේ |
| සොඳ ලෙසිනේ මිණි බරණ | ලෙසේ | | |
| | | ඈතට පෙනුනේ රන් කොත | ලෙසිනේ |
| අප ගොසිනේ මල දැක | නෙතිනේ | | |
| | | හිත පිරිය වුනේ නිම නැති | ලෙසිනේ |
| මෙම ලෙසිනේ තල මල | පිපුණේ | | |
| | | සකි පිය සකිනේ සොඳ ගල | මුදුනේ |

## කාර්ය පත්‍රිකාව

- නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| 01. තල මල සමාන වන්නේ | මල පිපීමෙන් පසු |
| 02. අවුරුදු 100කට පසුව පිපෙන මල | තල් ගස |
| 03. තල මලේ ආයු කාලය | තල මල |
| 04. තල් ගස මිය යනුයේ | මුතු කුඩයට |
| 05. වියලි කලාපයේ වැවෙන ශාකයකි. | මාස 3යි. |

- පහත වාක්‍ය හරිනම් (✓) ලකුණද වැරදි නම් (✗) ලකුණද යොදන්න.

1. තල් ගස වැඩි වශයෙන් යාපනය ප්‍රදේශයේ දක්නට ලැබේ. ( )
2. තල මල පිපීම ගමට සුභ දර්ශනයකි. ( )
3. තල මල කපා ගෙන යනු ලබන්නේ කරත්තයෙනි. ( )
4. තල මල වරුණ කවි භාවිතා කරමින් නර්තන නිර්මාණය කරයි. ( )
5. තල මල පිපීමෙන් පසු තල් ගෙඩි හට ගනී. ( )

- පහත දැක්වෙන සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(1) තල මලේ දක්නට ඇති සුවිශේෂී ලක්ෂණ ලියන්න.

(2) ඔබ කැමති තල මල වරුණ කවියක් ලියා දක්වන්න.

(3) තල මල පිපීමෙන් ගම් 7ක් පාළු වන බවට සඳහන් වන්නේ කුමක් නිසාද?

(4) ලෙළ දෙමිනේ මල උඩුගුවනේ ......... යන කවිය ගායනා කළ හැකි තාල රූපය නම් කරන්න.

(5) තල මලේ සුන්දරත්වය කවියකට නැගීමට ජන කවීන් පෙළඹුන හේතුව කුමක්ද?

| නර්තනය | | |
|---|---|---|
| 7 ශ්‍රේණිය. | 1 - වාරය | |
| ගුරුභවතාගේ නම : ඊ. පී. සචනි දිනේශිකා | | අම්/ උක්සිරිපුර විදුහල |

නිපුණතාව : 2.0 නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 2.6 නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

## <u>වන්නම් නර්තනය</u>

- 6 ශ්‍රේණියට නියමිතව ඇති හනුමා වන්නම සම්පූර්ණයෙන් නැටීම 7 ශ්‍රේණියේ දී කල යුතුව ඇත.
- 6 ශ්‍රේණියේ දී ඔබ හනුමා වන්නම ආරම්භයේ සිට කස්තිරම දක්වා නර්තනය කර ඇත.
- 7 ශ්‍රේණියේ දී සිරුමාරුව හා අඩව්ව සමගින් නර්තනය කල යුතුය.



### <u>හනුමා වන්නම</u>

තාලය : සුළු තති තිත 12 / 12
බෙර පදය : කුද ගත ගත දොම් /දොමි කිට කිට දොම්

තානම : තනම් දනත් තම් දනත් තනම් දන
තනම් දනත් තනෙනා......... තෙයි
තනම් දනත් තම් දනත් තනම් දන
තනම් දනත් තනෙනා................

කවිය : ගිරින් ගිරට පැන ලැගුම් සොයා
පුබුදමින් අරුණ කල මා - ගොර
දෙමින් නැවත වට පිටින් බලති නෙක
උසුළු විසුළු පුදුමා

එයින් නැවත පලතුරින් තුරට පැන
මලින් පල ද දලු මා - අත
දෙමින් රැගෙන කට කොණින් බුදති වට
පිටින් බියැති බැලුමා

දුටින් අයෙක් සට පටින් පැනුම් රැලි
පොටින් නෙරා සෙවුමා - බය
දුටින් එවිට අතු පතින් වසා මුව
ඉතින් නැතැයි පෙනුමා

මතින් උඩඟු සිත ගතින් වැඩිව පෙර
පැතුම් විලස දැරුමා - නැණ
යකින් මෙලෙස ඉසිමතින් යෙදුව පෙර
මෙවන් වරුණ හනුමා

**කස්තිරම**

රුංතක ජිංතක තරිකිට කුංදත්
තාග් ග ජිංතක තරිකිට කුංදත්
රුංතක ජිංතක තරිකිට කුංදත් තා

**සීරුමාරුව**

තකු තක ජිජි කුඳ ගජිත ගජිත කුඳ
ගජි ගත කුඳ කුඳ තා
කුජිත්ත ගත දොම් කිට තරිකිට කුන්දත් තා

**අඩව්ව**

තත් තොංග තක තොංග
තක්කඩ තරිකිට තකතොංග
තකට ජිකට තොංග ජික්කඩ තරිකිට තක තොංග
තාකු ජිත්ත ගත දොම්කිට තරිකිට කුන්දත් තා

<u>**කාර්ය පත්‍රිකාව**</u>

- සාම්ප්‍රදායන් 3හි වන්නම් ගණන ලියන්න

| සම්ප්‍රදාය | වන්නම් ගණන |
|---|---|
| උඩරට | |
| පහතරට | |
| සබරගමු | |

- ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1ක | | | | | | 4 |
| | | | | | | |
| | | | | 6 | | රා |
| | | 5 | | | | |
| 2 | | නු | | | | 7 |
| | | | | ට | | |
| 8 | | | | | | |
| 3 | | ද | | | | ව |

පහළට

1. වන්නමකට අයත් කොටසකි.

4. ගිරින් ගිරට පැන.....මෙම කවියෙන් කියවෙන්නේ කුමන සතා පිළිබඳවද,

5. වන්නම් යන්නෙහි අරුත් දේ,

6. වන්නම් 18ක් දැකිය හැකි සම්ප්‍රදාය වන්නේ.

7.වන්නමකදී අවසානයට නටනුයේ.

8. වන්නමක දී ගායනය කරනුයේ.

හරහට

1. උඩරට වන්නම් ගායනා කල ස්ථානය.

2. උඩරට වන්නම් රචනා කල යුගය,

3. උඩරට හා සබරගමු වන්නම් රචනා වී ඇත්තේ කුමක් අරභයා ද,

➢ පහත සදහන් වැකි නිවැරදි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( x ) ලකුණද යොදන්න.

1. තානම වන්නමකට අයත් කොටසක් නොවේ. ( )
2. මුල් යුගයේ වන්නම් ගායනය සඳහා රචනා වී ඇත. ( )
3. සම්ප්‍රදායන් තුනෙහිම වන්නම් දැකිය හැකිය. ( )
4. වන්නම් සඳහා පසු කාලීනව නර්තනය යොදා ගෙන ඇත. ( )
5. වන්නම් ශාස්ත්‍රීය නර්තන අංගයක් නොවේ ( )

➢ හනුමා වන්නම නර්තනය කිරීමේ දී ඔබට අසන්න ලැබූ සුවිශේෂිත වචන සඳහා යටින් ඉරක් අඳින්න

ඉරට්ටිය ගී මණ්ඩිය කලාසම අලංකාර පද මණ්ඩිය හස්ත චලන

➢ පහත කවිය සම්පූර්ණ කරන්න

එයින් ......................පලතුරින් ...................

..............................පලද දලුමා - අත

දෙමින් රැගෙන කට කොනින් .....................

පිටින් ..............................................බැලුමා

➢ පහත වගුව සම්පූර්ණ කරන්න

| වන්නම | තාලරූපය | බෙරපදය |
|---|---|---|
| හනුමා | | |

➢ හනුවා වන්නමේ බෙර පදය ප්‍රස්තාර කරන්න

| 1 2 | 1 2 | 1 2 | 1 2 |
|---|---|---|---|
| | | | |

➢ මෙම වගුවේ වචන අනුපිළිවලට සකසා නැවත ඉදිරියෙන් ලියන්න

| | |
|---|---|
| අඩව්ව | |
| කවිය | |
| කස්තිරම | |
| බෙරපදය | |
| සිරුමාරුව | |
| තානම | |

➢ හනුමා වන්නම සම්පූර්ණයෙන් නටන්න

නර්තනය

7 ශ්‍රේණිය. 1 - වාරය

ගුරුභවතාගේ නම : ඩබ්ලිව්.ජී. චින්තා පෙරේරා අම්/ සද්ධාතිස්ස මහා විද්‍යාලය

නිපුණතාව : 2.0 නර්තනය හා බැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 2.6 විධි ක්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි.

## <u>ප්‍රස්තාරකරණය</u>

### <u>දෙතිතේ ප්‍රභේද හඳුනා ගැනීම</u>

මාත්‍රා 2, මාත්‍රා 3, මාත්‍රා 4 (සුළු, මැදුම්, මහ) යන මූලික තිත් රූප තුන ආශ්‍රයෙන් දෙතිතේ තිත් රූප ගොඩ නැගේ.

දෙතිතේ ප්‍රභේද

| සුළු මැදුම් දෙතිත | සුළු මහ දෙතිත | මැදුම් මහ දෙතිත |
|---|---|---|
| මාත්‍ර 2 + 3 | මාත්‍රා 2 + 4 | මාත්‍රා 3 + 4 |

- ප්‍රස්තාරකරණය යනු අප විසින් කරන නර්තන, ගායන හා වාදන ක්‍රියාකාරකම් ලිඛිතව සටහන් කිරීමයි.
- දෙතිතේ ප්‍රභේද ප්‍රස්තාර කිරීමේ දී තාල සංඥා මෙලෙස භාවිත කෙරේ.
  - තිත් ^
  - තෙයි /

### <u>බෙරපද ප්‍රස්තාර කිරීම</u>

(1) 2 + 3 තාල රූපය - සුළු මැදුම් දෙතිත

| | ^<br>1 2 | /<br>1 2 3 | ^<br>1 2 | /<br>1 2 3 |
|---|---|---|---|---|
| උඩරට | දොං - | ජිං - ත | ග ත | දොං - ත |

(2) 2 + 4 තාල රූපය - සුළු මහ දෙතිත

| | ^<br>1 2 | /<br>1 2 3 4 | ^<br>1 2 | /<br>1 2 3 4 |
|---|---|---|---|---|
| උඩරට | දොං - | දොං - ජිං - | ජිං - | ග ජී ග ත |

(3) 3 + 4 තාල රූපය - මැදුම් මහ දෙතිත

| | ^<br>1 2 3 | /<br>1 2 3 4 | ^<br>1 2 3 | /<br>1 2 3 4 |
|---|---|---|---|---|
| උඩරට | දෝං - - | ජිං - ජිං - | ත ක ට | දොං - ත ක |

## තාලම් කවි ප්‍රස්තාර කිරීම

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| අ | ගේ | - | ව | ඩ | න | ම | ගෙ | තා | - | ලම් | - |
| හ | ර | ඹ | බ | ලත් | - | නේ | - | - | - | - | - |
| ව | ගේ | - | නො | දූ | න | ඇ | යි | නූ | ඔ | ලා | - |
| කී | - | ම | ට | එත් | - | නේ | - | - | - | - | - |
| ක | ගේ | - | ගිල් | - | ල | ලෙ | ස | බැ | රි | වෙයි | - |
| නු | ඹ | ට | බො | ලත් | - | නේ | - | - | - | - | - |
| ම | ගේ | - | දෑ | - | න | තා | - | ල | මි | ප | ට |
| හ | ර | ඹ | බ | ලත් | - | නේ | - | - | - | - | - |

## කුළු කවි ප්‍රස්තාර කිරීම

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| ළ | මා | - | ලි | යෝ | - | ග | ව | සා | - | මල් | - |
| ව | ර | ළ | පි | ට | - | - | - | - | - | - | - |
| ද | මා | - | ක | ර | ට | මු | තු | පො | ට | අ | ත |
| ව | ළ | ලු | ව | ට | - | - | - | - | - | - | - |
| පෙ | මා | - | ව | ඩ | න | ලෙ | ස | ස | ර | සා | - |
| ඹ | ස | රි | පො | ට | - | - | - | - | - | - | - |
| ප | මා | - | නො | ව | ර | ග | ති | කු | ලු | ගෙ | න |
| ස | බේ | - | පි | ට | - | - | - | - | - | - | - |

## මල් යහන් කවි ප්‍රස්තාර කිරීම

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| පු | ටු | ව | ස | ර | ස | ලයි | - | ම | ම | සැ | ල |
| ක | රන් | - | නේ | - | - | - | - | - | - | - | - |
| පු | ටු | වෙ | ති | යෙ | න | ද | එ | බු | ල | තුයි | - |
| පු | දන් | - | නේ | - | - | - | - | - | - | - | - |
| කැ | ටු | ව | සිව් | - | ව | රන් | - | ස | ම | ගින් | - |
| බ | ලන් | - | නේ | - | - | - | - | - | - | - | - |
| ශ්‍රි | යා | - | දේ | - | වි | මල් | - | අ | ස් | නෙ | ට |
| ව | ඩින් | - | නේ | - | - | - | - | - | - | - | - |

## තුරඟා වන්නම ප්‍රස්තාර කිරීම

| | ^ 1 | 2 | / 1 | 2 | 3 | ^ 1 | 2 | / 1 | 2 | 3 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙර පදය | දොං | - | ජිං | - | ත | ග | ත | දොං | - | ත | |
| තානම | තත් | - | තත් | - | ත | තත් | - | ත | තෙ | න | |
| | තත් | - | තත් | - | ත | තත් | - | ත | තෙ | න | |
| | තත් | - | තත් | - | ත | තත් | - | තුම් | - | ද | |
| | තා | - | තා | - | - | - | - | - | - | - | |
| | ත | න | ත | තෙ | න | ත | න | ත | තෙ | න | |
| | ත | ත | න | තුම් | - | ද | න | ත | තෙ | න | |
| | තා | - | තත් | - | ත | තත් | - | තුම් | ද | - | |
| | තා | - | තා | - | - | - | - | - | - | - | |
| කවිය | සත් | - | වෙත් | - | ම | හත් | - | අ | ද | ර | |
| | ලත් | - | යුත් | - | සි | දුත් | - | කු | ම | රු | |
| | ගත් | - | සිත් | - | තො | සත් | - | පැ | වි | දි | |
| | අං | - | ගා | - | - | - | - | - | - | - | |
| කස්තිරම | කු | ඳ | ග | ජී | ත | කු | ඳ | ග | ජී | ත | }// |
| | කු | ඳ | ග | ජී | ත | කු | ඳ | තා | - | | |
| | කු | ඳ | ග | ජී | ත | කු | ඳ | තා | - | | // |
| | කු | ඳ | තා | - | | කු | ඳ | තා | | | |
| | කු | ඳ | ග | ජී | ත | කු | ඳ | ග | ජී | ත | |
| | කු | ඳ | ග | ජී | ත | කු | ඳ | තා | | | |

## කාර්ය පත්‍රිකාව

➢ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. දෙතිතේ ප්‍රභේද ගණන

1. 4 කි  2. 3 කි  3. 5 කි  4. 2 කි

02. සුළු මහ දෙතිතට අයත් බෙර පදයකි.

1. දොං දොංජිං ජිං ගජිගත  2. කුද ගත ගත දොං

3. දොං ජිංත ගත දොංත  4. ජිංගත ගොගො

03. තිත් තෙයි තාල සංඥා දැක්විය හැකි ආකාරය.

1. / /  2. ^ ^  3. ^ /  4. / ^

04. තුරඟා වන්නමේ තාල රූපය වනුයේ,

1. මැදුම් මහ දෙතිත 2. සුළු මහ දෙතිත
3. සුළු මැදුම් දෙතිත 4. මැදුම් තනි තිත

05. දෝං ජිංජිං තකට දොංතක යනු,

1. මැදුම් මහ දෙතිතේ බෙර පදයකි. 2. සුළු මැදුම් දෙතිතේ බෙර පදයකි
3. සුළු මහ දෙතිතේ බෙර පදයකි 4. දෙසුළු මැදුම් තුන්තිතේ බෙර පදයකි.

➢ පහත වගන්ති හරිනම් (√) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.

01. ප්‍රස්තාරකරණය යනු වාදන ක්‍රියාවලියකි. ( )

02. "රන් තැඹිලි ගස් දෙකයි" යන සුළු මැදුම් දෙතිතේ රබන් පදයකි. ( )

03. තාලම්පටින් වැයෙන ධවනි ගණන 4 කි. ( )

04. "ළමා ලියෝ ගවසා මල් වරල පිට" යනු මල් යහන් කවියකි. ( )

05. දොං ජිජි ගත යනු සුළු තනි තිතට අයත් බෙර පදයකි. ( )

➢ පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. හනුමා වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.

02. "මොර හිඹුටු දම් පනා - අඹ දඹද ඇටඹිනා

කජු පේර වරකිනා - කැදලි විලිකුන් ගෙනා"

යන කවිය සුළු මැදුම් දෙතිතට ප්‍රස්තාර කරන්න.

03. දෙතිතේ ප්‍රභේද වලට අයත් බෙර පද ප්‍රස්තාර කරන්න.

04. තුරඟා වන්නමේ කස්තිරම ප්‍රස්තාර කරන්න.

05. "රන් වන් කරල් සැලෙයි" ගීතයේ කොටසක් අදාල තිත් රූපයට අනුව තාල තබමින් ගායනය කරන්න.

නර්තනය

7 ශ්‍රේණිය. 11 - වාරය

ගුරුභවතාගේ නම : Y.G.U.S. රාජපක්ෂ අම්/සද්ධාතිස්ස මහා විද්‍යාලය

නිපුණතාව : 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලැබෙන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තනය නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම: 1.3 ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂී ලක්ෂණ හඳුනාගනිමින් නර්තනය නිර්මාණය කරයි.

## කුලු හා තාලම් නැටුම් නිර්මාණය කරමු.

කුල්ල නමැති භාණ්ඩය යොදා ගනිමින් ගෘහස්ථව හා කමතෙහිදී කරනු ලබන කාර්යයන් නිරූපණය වන සේ, නිර්මාණය කරන ලද ගැමි නැටුම් වෙසස " කුලු නැටුම් " ලෙස හඳුන්වනු ලබයි. කුල්ලෙන් කෙරෙන බොහෝ කාර්යයන් කාන්තාවන් විසින් ඉටු කරනු ලබන හෙයින් කුලු නැටුම කාන්තාවන් සඳහා සුවිශේෂී වූ නර්තන අංගයක් ලෙස සැලකේ.



- **කුලු නැටුම පිළිබඳ විවිධ මත,**

* ශාන්තිකර්මයන් හීදී කුල්ල රගෙන කරනු ලබන සරල චලන ඇසුරින් නිර්මාණය වී ඇති බව
* සොකරි නම් ගැමි නාටකයේ වී කෙටීම, පෙළීම ඇසුරින් කුලු නැටුම නිර්මාණය වී ඇති බව
* කේ. ඇස්. ප්‍රනාන්දු නමැති ප්‍රවීණ පහත රට නර්තන ශිල්පියා ගුරුවරයෙකු වශයෙන් සිටියදී යුනෙස්කො පාසල් නර්තන සඳහා කුලු නර්තනයක් ඉදිරිපත් කර ඇති බව

අද්‍යතනයේ වඩාත් ජනප්‍රිය කුලු නැටුම සඳහා මිහිරි නාද මාලාවන්ගෙන් යුත් ගායන රාශියක් ප්‍රචලිත භාවිතයේ ඇත. ඇතැම් ගීත " රත්නමාලී කාව්‍යයෙන් " උපුටාගෙන ඇති අතර එකී ගායනාවන්ගේ ඇතැම් පද කොටස් කුලු නර්තනයට උචිත වන පරිදි නිර්මාණය කර ඇත.

- **කුලු නර්තන නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු,**

  * සාමූහික නර්තනයක් බව
  * කුල්ල රගෙන සබයට එන ආකාරය
  * කුල්ලෙන් වී හුලං කිරීම
  * කුල්ලෙන් වී පිරවීම
  * අතින් අත මාරු කර යැවීම
  * වී පෙළීම හා පූ කිරීම
  * පොළන ලද වී පසකට දැමීම
  * අවකාශ භාවිතය
  * රංග රටා නිර්මාණය

කුලු කවි ගායනා කරමින් කුලු නර්නන නිර්මාණයේදී ඉහත ලක්ෂණ සැලකිල්ලට ගනිමු.

## ➢ තාලම් නැටුමක් නිර්මාණය කරමු.

ශ්‍රී ලාංකේය ජන නැටුම් අතර තාලම් නර්තනය සුවිශේෂී නර්තනාංගයක් ලෙස සැලකේ. තාලම්පට රංග භාණ්ඩය ලෙස භාවිතා කරමින් ඒකල, යුගල, සාමූහික වශයෙන් නර්තනයේ යෙදේ. තාලම් නර්තනයේ රංග වින්‍යාසය වශයෙන් යෙදී ඇත්තේ එකිනෙකා අතැති තාලම්පට විවිධ තාල රූපයන්ට අනුව වාදනය කරමින් ඒ අනුව නර්තනයේ යෙදීමයි.

තාලම් නැටුමේ චලන මධ්‍ය ලය සහ දෘත ලය ඇසුරු කර ගනී. තාලම් ගායන මගින් නර්තනයේ යෙදීමට අවශ්‍ය කරන ජවය සහ වේගයත් , නර්තනයට පෙළඹවීමත් ඇති කරනු ලබයි.

තාලම්පට පංචතූර්ය වාද්‍ය භාණ්ඩයක් වන හෙයින් ‘‘ තාලම්පට උපත ‘‘ පිළිබඳ රචනා වූ උපත් කවි මාලාවක්ද ව්‍යවහාරයේ පවතී. ඇතැම් කවි ප්‍රතිවාදීන්ට අභියෝගාත්මක ස්වරූපයෙන් රචනා වී ඇත. ‘‘ තාලම් උපත් ‘‘ කවි මගින් තාලම්පට විස්කම් දෙව් දුවගේ නිර්මාණයක් බවද සඳහන්වේ. තාලම් නැටුමට අදාල ගායනා වලදී මෙම තොරතුරු කියවේ.

| | | |
|---|---|---|
| උදා : | එදා මුනිඳු බුදු වන දා අහස් කුසෙන් | බැස |
| | නදා සිතින් දෙව් මණ්ඩල වැයුවා තුරු | ගොස |
| | සදා රනින් තාලම්පට ගෙන ගඳඹුන් | තොස |
| | විදා තාල තිත් තෙයි පද වයමින් හඬ | යස |



**කාර්ය පත්‍රිකාව**

- ගැලපෙන පිළිතුර තෝරා අදාල ඉංග්‍රිසි අක්ෂරය හිස්තැන මත ලියන්න.



A



B

1. කාන්තාවන් සඳහා විශේෂ වු නර්තන අංගයකි. (……..)
2. විස්කම් දෙව් විසින් නිර්මාණය කරන ලද රංග උපකරණයකි. (……..)
3. මධ්‍ය ලය සහ දෘත ලය ඇසුරු කොට නර්තන නිර්මාණය කරයි. (..........)
4. රත්නමාලි කාව්‍යයේ එන කවි නර්තනයට සුදුසු පරිදි යොදාගනී. (..........)
5. ස්ත්‍රීන් හා පුරුෂයන් දෙපිරිසම නර්තනයේ යෙදේ. (..........)
6. කේ.ඇස්. ප්‍රනාන්දු විසින් නර්තන තරගාවලියක් සඳහා ඉදිරිපත් කර ඇති නර්තනයකි. (..........)

- හිස්තැන් පුරවන්න.

1. ……………………………………………… පංචතූර්ය වාද්‍ය භාණ්ඩයක් වේ.
2. එදා මුනිදු බුදුවන දා අහස් කුසෙන් බැස මෙම ……………………………………………… කවිය කීය.
3. තාලම්පට නිර්මාණය කළා යැයි සැලකෙන්නේ ..........................................................................
4. ......................................................... කාන්තාවන් වැඩි වශයෙන් නිවසේදී භාවිතා කරන උපකරණයකි.
5. ඇතැම් ශාන්තිකර්මවලදී ................................................ අදාල චලන දක්නට ලැබේ.

- පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1. කුලු නර්තනයේ සුවිශේෂී ලක්ෂණ නම් කරන්න.
2. කුලු නර්තනයේ ආරම්භයට බලපෑ හේතු සාධක නම් කරන්න.
3. ඔබ කැමති තාලම් කවියක් ලියන්න.
4. තාලම් නර්තනයේ සුවිශේෂී ලක්ෂණ ලියන්න.
5. කුලු නැටුම හා තාලම් නැටුම දක්නට ලැබෙන අවස්ථා නම් කරන්න.

නර්තනය

7 ශ්‍රේණිය. 11 - වාරය

ගුරුභවතාගේ නම : ඩබ්ලිව්.සුරංගා කසුන්මාලි අම්/පාදාගොඩ විද්‍යාලය

නිපුණතාව : 3.0 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 3.2 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ භාවිත කරමින් ශබ්ද හා නාද නිපදවයි.

## සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ

සමූහ වාදනයක් කරමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කිරීම සඳහා සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ මෙන්ම විකල්ප වාද්‍ය උපකරණ උපයෝගී කර ගත හැකිය.මේ සඳහා ගැටබෙරය, පහතරට බෙරය, දවුල, තම්මැට්ටම, උඩැක්කිය, රබාන සූදානම් කරගත හැකිය. මේවා එක් වර්ගයකින් එක් භාණ්ඩයක් වත් තිබිය යුතුය. එසේ ම 06 ශ්‍රේණියේ දී මෙන්ම 07 ශ්‍රේණියේ දී නිපදවාගත් විකල්ප වාද්‍ය උපකරණ එක් වර්ගයකින් දෙක බැගින් හෝ යොදා ගත යුතුය.

උදා- සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩයක් වන ගැටබෙරය හා එයට විකල්ප වාද්‍ය උපකරණයක් ලෙස සකස් කරන ලද ටින් බෙර දෙකක් ගැනීම සුදුසු ය.

මෙසේ සකස් කර ගත් භාණ්ඩවලට සහ සාම්ප්‍රදායික භාණ්ඩවලට තට්ටු කිරීමේ දී නොයෙක් ආකාරයේ ශබ්ද නිපදවෙයි.තාලයකට අනුව බෙර පද වාදනයේ දී ඒවාට අදාළ ශබ්ද ධ්වනි වාදන භාණ්ඩවලින් වාදනය කළ හැකිය.

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| / | | | / | | | / | | | / | |
| 1 | 2 | | 1 | 2 | | 1 | 2 | | 1 | 2 |
| කු | ද | | ග | ත | | ග | ත | | දොම් | - |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| / | | | / | | | / | | | / | | |
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| කු | ද | ට | ග | ත | ට | කු | ද | ට | ග | ජිං | - |

| ගැටබෙරය | විකල්ප වාද්‍ය උපකරණ- තම්මැට්ටම | දවුල | ගැටබෙරය, විකල්ප වාද්‍ය උපකරණ, දවුල |
|---|---|---|---|
| කු ද ට | ග ත ට | කු ද ට | ග ජිං |

මේ ආකාරයට බෙර පද වෙනුවට විකල්ප බෙර පද යොදා ගැනීම ද කළ හැකිය.




<u>තේමාවකට අනුව වාදන</u>

උගත් පද ඇසුරෙන් නොයෙක් ආකාරයට වාදනය සිදු කළ හැකි අතර තේමාවක් අනුව වාදනය කිරීම ද කළ හැකිය.

වටිනා සංස්කෘතික අංගයක් වන “පෙරහර” තේමා කරගනිමින් වාදනයක් නිර්මාණය කිරීමේදී එහි නාද පිළිබඳ අවධානයට යොමු කළ හැකිය.

- කස හඬ සඳහා එහි හඬ උපදවන ආකාරයට විකල්ප වාදන උපකරණයක් නිර්මාණය කිරීමේ දී ගොක්කොළ කිහිපයක් දිගට ඉරා වෙන් කර ගත හැකිය.

- හේවිසි හඬ වෙනුවට ටින් බෙර, අයිස්ක්‍රීම් කෝප්ප වලින් සෑදූ තම්මැට්ටම් ,ගස්ලබු බටයෙන් සෑදූමලත් නලාව ආදිය ගැනීමට පුළුවනි.

- ගැමි නැටුම්වල දී ලී එකට ගැසීමෙන් ලී කෙළි තාල හඬට ද , පොල් කටු එකට ගැසීමෙන් පතුරු නැටුමේ හඬට සමාන හඬක් උපදවාගත හැකිය.

මේ ආකාරයට විකල්ප වාදන භාණ්ඩ හසුරුවා පෙරහැරක් සඳහා සමූහ වාදනයක් ඉදිරිපත් කළ හැකිය.



## කාර්ය පත්‍රිකාව

- හරි නම් (✓) ලකුණ ද වැරදි නම් ( × ) ලකුණ ද වරහන තුළ යොදන්න.

(01) සමූහ වාදනයක් කරමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කිරීම සඳහා සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ මෙන්ම විකල්ප වාද්‍ය උපකරණ ද උපයෝගී කර ගත හැකිය. ( )

(02) ගැටබෙරය, පහතරට බෙරය, දවුල, තම්මැට්ටම, උඩැක්කිය, රබාන විකල්ප වාද්‍ය උපකරණයන් ය. ( )

(03) පෙරහැර වටිනා දෘෂ්‍යමාන සංස්කෘතිකාංගයකි. ( )

(04) “කුද ගත ගත දොම්” සුලු තනි තිතට අයත් බෙර පදයකි. ( )

(05) මැදුම් තනි තිතට මාත්‍රා 4ක් අයත් වේ. ( )

- වරහනෙහි ඇති පද අතුරෙන් සුදුසු පද තෝරා පහත වාක්‍යවල හිස්තැන් පුරවන්න.

( ටින් බෙර, විකල්ප, පෙරහැර , ගොප් කොළ , ගස්ලබු )

(06) පෙරහැරක කස හඬ නිර්මාණය කර ගැනීම සඳහා.........................භාවිත කළ හැකි ය.

(07) ......................... වාද්‍ය උපකරණ භාවිතයෙන් තේමාවන්ට අනුව විවිධ අවස්ථා ඉදිරිපත් කළ හැකිය.

(08) වාද්‍ය භාණ්ඩ ගණනාවක නාදය ඇසිය හැකි අවස්ථාවක් ලෙස .......................... සඳහන් කළ හැකිය.

(09) .......................... බටයෙන් සාදා ගන්නා නළා හඬ ද පෙරහැරක දී මතු කර දැක්වේ.

(10) බෙරවල හඬ මතු කර ගැනීමට ............................ යොදා ගත හැකිය.

- නිවැරදි පිළිතුරු සපයන්න.

(01) සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ 05 ක් නම් කරන්න.

(02) විකල්ප වාද්‍ය උපකරණ 05 ක් නම් කරන්න.

(03) තේමාවට අනුව වාදනය ඉදිරිපත් කළ හැකි අවස්ථා 03ක් නම් කරන්න.

(04) පෙරහැරක තේමාවක් යටතේ වාදනයක් ඉදිරිපත් කිරීමේ දී යොදා ගත හැකි විකල්ප වාද්‍ය උපකරණ 05 ක් නම් කරන්න.

(05) සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ 02ක හා විකල්ප වාද්‍ය උපකරණ 02ක රූප සටහන් අඳින්න.

නර්තනය

7 ශ්‍රේණිය. 11 - වාරය

ගුරුභවතාගේ නම : Y.G.U.S. රාජපක්ෂ අම්/සද්ධාතිස්ස මහා විද්‍යාලය

නිපුණතාව: 4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනා වල පසුබිම අධ්‍යනය කරමින් ගායනා කුසලතා ප්‍රදර්ශනය කරයි

නිපුණතා මට්ටම: 4.1 නිර්දේශිත ගායනා වල සමාජීය හා සංස්කෘතික පසුබිම විස්තර කරයි

## කුලු කවි හා බැදි සමාජ සංස්කෘතික පසුබිම අධ්‍යයනය කිරීම.

කුල්ල හා බැඳි ක්‍රියාකාරකම් පදනම් කොට ගෙන කුලු කවි නිර්මාණය වී ඇත. ගැමි කාන්තාවන්ගේ දෛනික ජීවිතය සමඟ කුල්ලෙහි ඇති බැඳීම කෙතරම්ද යත් “ගැහැණියකගේ පින කුලු මුල්ලේ සැඟවී ඇතැයි “ යනුවෙන් ආප්තෝපදේශයන් පවා පටබැඳී ඇත. මුළුතැන්ගෙයි කටයුතු වලදී සුනුසාල් , ඇකටි වැනි දේ ඉවත් කිරීමටත් මුං, කව්පි, තල, මිනේරි වැනි කටුසර බෝග පිරිසිදු කිරීමටත් කුල්ල යොදා ගනී.



කුල්ලෙන් පෙළීමේදී දැතේ ඇඟිලි තුඩු කුල්ලෙහි යටි පැත්තේ වදින්නට සලස්වමින් තාලානුකුල ශබ්දයක් උත්පාදනය කරමින් කරන වී පෙළීම මන බඳින සුලු කටයුත්තකි. සරල ගායන රටාවත් , සරල බස් වහරත් නිසා කුලු කවි ගැමි ගායනා අතර ප්‍රමුඛත්වයක් උසුලයි.

කාන්තාවන් ගැන මෙන්ම කුල්ල උපයෝගී කර ගනිමින් සිදුකරන ක්‍රියාකාරකම් පිළිබඳව ද කුලු ගායනා තුළ අන්තර් ගත වී ඇත.

## සමාජය තුළදී කුල්ල භාවිතා වන අවස්ථා,

- කෘෂිකාර්මික සමාජය තුළ කුල්ල එකී කටයුතු සඳහා අත්‍යවශ්‍ය උපකරණයකි.
- කමත් බසින් කුල්ල හඳුන්වන්නේ “ යතුර “ යන පාරිභාෂිත පදයෙනි.
- වී හුලං කිරීමට
- බැතෙහි කාටුව පිස දැමීමට
- වී ගෝනි වලට හෝ මලු වලට බැත පිරවීමට
- කුල්ල භාවිතයට ප්‍රථම එයට වැද නමස්කාර කිරීම සිරිතයි.
- එසේ හෙයින් කුල්ල කමත් බිමෙහි දී පූජා භාණ්ඩයකි.
- ඇතැම් ශාන්ති කර්ම වලදී පිදේනි දීම සඳහා කුල්ල භාවිතයට ගැනේ. (කුල්ලේ පිදේනිය, කුනුමුත්තා පිදීම )
- ඇතැම් අභිචාර අවස්ථා වලදී ලිප ගිනි ඇවිලීම සඳහා කුල්ල යොදා ගනී.
- පහතරට රට යකුම යාගයේ දී කුල්ල උපයෝගී කර ගනිමින් සිදු කරනු ලබන නර්තනයන් ඇත.
- සොකරි ජන නාටකයේ දී කුල්ල රංග භාණ්ඩයක් ලෙස යොදා ගනී.

මේ අනුව බලන කල කුල්ල ගැමි ජීවිතය තුල බහු කාර්යය භාණ්ඩයකි. බට පතුරෙන් වියා , වේවැලෙන් හෝ කල වැලෙන් ගැටිති යොදා සකස් කර ගත් කුල්ල අලංකාර භාණ්ඩයකි. එහි ඇති වියමන් රටා මගින් එහි කලාත්මක බව වැඩි කරයි. ඇතැම් ගෘහණියන් කුල්ල පිට පැත්තෙහි බෙලි ලාටු උළා අව්වේ දමා වේලා ගනිති. එමගින් කුල්ල ශක්තිමත් වන අතර හිස්තැන් ද වැසී යයි

- **<u>කුලු කවි</u>**

තාල රූපය මාත්‍රා 3



කැලේ ගොසින් බට පතුරු කපන්නේ
පලා පුරුක් හැර අව්වේ දමන්නේ
නමා දෙකොන මුළු අස්සේ පුරන්නේ
රටා දමාලයි කුල්ල වියන්නේ

ළමා ලියෝ ගවසා මල් වරල පිට
දමා කරට මුතුපොට අත වළලු වට
පෙමා වචන ලෙස සරසා ඔමරි පොට
පමා නොව රඟත් කුලු ගෙන සබේ පිට

## <u>තාලම් කවි හා බැදි සමාජ සංස්කෘතික පසුබිම අධ්‍යනය කිරීම.</u>

ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ගැමි ගායනා අතර තාලම් කවි සුවිශේෂී වේ. නර්තන, ගායන, වාදන ත්‍රිත්ව ක්‍රියාවලියේදී තාලය තැබීම හෙවත් තාලය මතුකොට දැක්වීම තාලම්පටින් සිදුවේ. මෙම තාලම්පට හා බැඳි ගායනා තාලම් කවි ලෙස හැඳින්වේ.

- **<u>තාලම් කවි</u>**

තාල රූපය මාත්‍රා 3

අගය වඩන මගේ තාලම් හරඹ බලන්නේ
වගේ නොදැන ඇයි නුබලා කීමට එන්නේ
තගේ ගිල්ල ලෙස බැරිවෙයි නුඹට බොලන්නේ
මගේ දැතේ තාලම්පට හරඹ බලන්නේ

එනවා ඇදුරෝ තරගෙට කීම කියාගෙන
දනවා හදවත තාලම් උපත ඇසූ තැන
මොනවා වත් දන්නේ නැතිව සබයට ආ තැන
දෙනවා මගේ තාලම් පට උපත කියාගෙන

තාල රූපය මාත්‍රා 4

සඳවට තරු වැල් ඇවිදින් කළ එළි සද්දේ
මඳකොට පවසමින් ඇවිදින් ඇරඹුණ යුද්දේ
යුදයට වස වතු ඇවිදින් පැරදුණ යුද්දේ
බඳවට කැරකෙන මාගේ තාලම්පට සද්දේ



විවිධ තාල රූපයන්ට අනුකූලව ඉදිරිපත් කරනු ලබන මෙකී ගායනාවන් මගින් නර්තනයේ යෙදීමට අවශ්‍ය කරන ජවය , වේගය නර්තනයට පෙළඹවීමත් ඇති කරනු ලබයි.

අනෙකුත් ගැමි ගායනාවන් දෙස බලන විට තාලම් කවි එදිනෙදා ජන ජීවිතයේදී ගැමියන් සමඟ බැඳෙන ජීවන වෘත්තීන්, කෙළි සෙල්ලම් හෝ ඇදහිලි විශ්වාස සමඟ තාලම් කවිවල ඍජු සබඳතාවක් දක්නට නොලැබේ.

දැනට නිර්මාණය වී ඇති තාලම් කවි පිළිබඳව විමසා බැලීමේදී තමන්ගේ ප්‍රතිවාදීන්ට අභියෝග කරන ආකාරයත් , සරල භාෂා ශෛලියක් යොදා ගැනීමත් විවිධ නාද මාලා ඔස්සේ ගායනා කිරීමට හැකි වීමත් මෙහිදී සුවිශේෂී වේ.

<u>කාර්ය පත්‍රිකාව</u>

➢ පහත සඳහන් වාක්‍යවල හිස්තැන් පුරවන්න.

1. කමතේදී කුල්ල ................................................... යනුවෙන් හැඳින්වේ.
2. ........................................................ භාණ්ඩයක් ලෙස කමතේදී කුල්ල යොදාගනී.
3. පහතරට ශාන්ති කර්මයේදී කුල්ල උපයෝගී කරගනු ලබන්නේ .........................................
   ........................... යාගයේදීය.
4. ප්‍රතිවාදින්ට අභියෝග කරන ගායනා වෙසසකි .........................................................
5. " අගය වඩන මගේ තාලම් හරඹ බලන්නේ " මෙම කවියේ ඊළඟ පද පේළිය වන්නේ ..........................................................................................
6. කුල්ල රංග භාණ්ඩයක් ලෙස .................................. ජන නාටකයේදී භාවිතා වේ.

➢ පහත වාක්‍ය හරි නම් (✓) ලකුණද වැරදි නම් (✗) ලකුණද යොදන්න.

1. " ඇත සිටන් එන්නි සෙල්ලි සෙල්ලියේ " තාලම් කවියකි. ( )
2. බහුකාර්යය උපකරණයක් ලෙස කුල්ල හැඳින්වේ. ( )
3. කුල්ල පිළිබඳ ආප්තෝපදේශන පවා පටබැඳී ඇත. ( )
4. තාලම් නර්තනයට පහතරට ප්‍රදේශයේ පෙරහැරවලදී සුවිශේෂී ස්ථානයක් හිමි වේ. ( )

➢ පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1. කුල්ල භාවිතා වන අවස්ථා නම් කරන්න.
2. තාලම් කවි වල සුවිශේෂී ලක්ෂණ දෙකක් නම් කරන්න.
3. ඔබ කැමති කුලු කවියක් ලියන්න.
4. ඔබ කැමති තාලම් කවියක් ලියන්න.
5. කුල්ලක් තැනීමේදී යොදා ගන්නා අමුද්‍රව්‍ය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

නර්තනය

7 ශ්‍රේණිය.  11 - වාරය

ගුරුභවතාගේ නම : ඩබ්ලිව්.සුරංගා කසුන්මාලි  අම්/පාදාගොඩ විද්‍යාලය

නිපුණතාව: 3.0 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 3.1 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

## <u>දවුල</u>



සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය වන්නේ දවුල යි. පුරාණයේ සිට ආගමික අවස්ථාවල තේවා හේවිසි වාදන, පෙරහර සඳහා මෙන්ම සන්නිවේදන කාර්යයට ද දවුල භාවිත කර ඇත. උදාහරණ ලෙස හේවිසි, අණබෙර, මළබෙර, රණබෙර දැක්විය හැකිය. මේ සෑම අවස්ථාවක ම දවුල් වාදනය ප්‍රධාන වන අතර සමහර අවස්ථාවල තම්මැට්ටම හා හොරණෑව සහය වාදන භාණ්ඩ ලෙස යොදා ගෙන ඇත.

දඹදෙණි අස්නෙහි "ලෝහ දවුල්, ජින දවුල්, මහ දවුල්..... වශයෙන් දවුල් වර්ග කීපයක් නම් කර ඇත. ලංකාවේ ඉපැරණි ජන කොට්ඨාසයක් වන වැදි ජනයා අතර පවතින්නේ ද දවුලට සමාන වූ සිලින්ඩාකාර බෙරයකි.

බෙර කඳ සඳහා
ඇහැළ,කොහොඹ,කොස්,මිල්ල , කිතුල්

බෙර ඇසට
හරක් හම් හෝ එළු හම්



බෙරයේ වට ප්‍රමාණය - අඟල් 45

බෙරයේ දිග - අඟල් 15

දවුලේ ඇති විශේෂත්වයක් වන්නේ එක් පැත්තක් අතින් සහ අනිත් පැත්ත උපකරණයක් භාවිත කරමින් වාදනය කිරීමයි. දවුල වාදනයට යොදා ගන්නා උපකරණ හඳුන්වන්නේ කඩිප්පුව නමිනි. එබැවින් පංචතූර්ය වර්ගීකරණයේ "විතතාතත" වර්ගයට දවුල අයත් වේ. කඩිප්පුව සෑදීම සඳහා 'ඇට්ටේරියා' වැනි ගස්වල කෝටු උපයෝගී කර ගනියි.





## දවුලේ කොටස්





## කාර්ය පත්‍රිකාව

➢ නිවැරදි පිළිතුර තෝරන්න.

(01) සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය වන්නේ,

(1) පහතරට බෙරය (2) දවුල

(3) තම්මැට්ටම (4) ගැටබෙරය

(02) ආගමික අවස්ථාවල දී දවුල සමග වාදනය කරන අනෙක් බෙර විශේෂය වන්නේ,

(1) බුම්මැඩිය (2) ගැටබෙරය

(3) තම්මැට්ටම (4) උඩැක්කිය

(03) දවුලේ වට ප්‍රමාණය,

(1) අඟල් 45 (2) අඟල් 46

(3) අඟල් 47 (2) අඟල් 48

(04) දවුල වාදනය කිරීම සඳහා ගන්නා උපකරණය වන්නේ,

(1) බෙර ලනුව (2) තාලම්පට

(3) කඩිප්පුව (4) උඩැක්කිය

(05) සිලින්ඩරාකාර හැඩයක් සහිත වාද්‍ය භාණ්ඩයකි

(1) තම්මැට්ටම (2) උඩැක්කිය

(3) ගැටබෙරය (4) දවුල

➢ වරහනෙහි ඇති පද අතුරෙන් සුදුසු පද තෝරා පහත වාක්‍යවල හිස්තැන් පුරවන්න.

( අණ බෙර, ඇට්ටේරියා, අඟල් 15, එලු හම, විතතාතත)

(06) කඩිප්පුව සෑදීම සඳහා …………….. වැනි ගස්වල කෝටු උපයෝගී කර ගනියි.

(07) සන්නිවේදන අවස්ථාවක් ලෙස දවුල යොදා ගැනීමේ දී එය හඳුන්වන්නේ ………………….. නමිනි.

(08) පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණයේ දවුල හඳුන්වනු ලබන්නේ ………………… වාද්‍ය භාණ්ඩයක් ලෙසයි.

(09) දවුලෙහි දිග ප්‍රමාණය ……………………. කි.

(10) දවුල් ඇස සඳහා …………….. යොදා ගනී.

➢ නිවැරදි පිළිතුරු සපයන්න.

(01) දඹදෙණි අස්නෙහි සඳහන් දවුල් වර්ග අතරින් දෙකක් නම් කරන්න.

(02) දවුල් කඳ සඳහා යොදා ගන්නා ලී වර්ග 05ක් නම් කරන්න.

(03) හේවිසි වාදනයේ දී දවුල සමඟ වාදනයට ගන්නා සහය වාදන භාණ්ඩ දෙක කුමක්ද?

(04) දවුල් ඇස සඳහා යොදා ගන්නා සම් වර්ග දෙක නම් කරන්න.

(05) දවුලක රූප සටහනක් ඇඳ නම් කරන්න.

නර්තනය

7 ශ්‍රේණිය.   11  - වාරය

ගුරුභවතාගේ නම : ඊ. පී. සවනි දිනේශිකා   අම්/ උක්සිරිපුර විදුහල

නිපුණතාව : 2.0 නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 2.5 නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

❖ 7 ශ්‍රේණියේ පළමු වාරයට නියමිත තුරඟා වන්නම ගායනය හා දෙවන වාරයට නියමිත තුරඟා වන්නම නර්තනය ඉදිරිපත් කරමු.

## වන්නම්

❖ වන්නම් යන්නෙහි අරුත වර්ණනාව නැතහොත් වැනුම යන්නයි.

❖ සම්ප්‍රදායන් තුනෙහිම දැකිය හැකි ශාස්ත්‍රීය නර්තන අංගයකි.

❖ වන්නම් රචනා වී ඇත්තේ ගායනය සඳහා ය.

❖ නමුත් වන්නම් පසු කාලීනව නර්තනය සඳහා යොදා ගෙන ඇත.

❖ උඩරට වන්නම් මහනුවර කවිකාර මඩුව, සින්දු වන්නම් දෙවුන්දර උපුල්වන් දේවාලය, සබරගමු වන්නම් සමන් දේවාලය අශ්‍රිතව නිර්මාණය වී ඇත.

❖ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍ර සිංහ රජුගේ කවිකාර මඩුවේ ගායනය කිරීම සඳහා උඩරට වන්නම් මහනුවර යුගයේ දී ගණිතාලංකාර බමුණු පඬිවරයා විසින් රචනා කර ඇත.

❖ උඩරට හා සබරගමු වන්නම් විනෝදය සඳහා රචනා වී ඇත.

❖ පහතරට වන්නම් විශ්ණු දෙවියන්ගේ ගුණ වර්ණනා කිරීම සඳහා රචනා වී ඇත.

❖ පහතරට වන්නම් සින්දු වන්නම් නමින් ද හඳුන්වයි.

❖ උඩරට වන්නම් 18 කි.

❖ පහතරට වන්නම් 32 කි.

❖ සබරගමු වන්නම් 21 කි.

❖ උඩරට වන්නමක් කොටස් 6කින් සමන්විතයි

බෙර පදය, තානම, කවිය, කස්තිරම, සිරුමාරුව, අඩව්ව

❖ නර්තන සම්ප්‍රදායන් අනුව වන්නම් වල නාදමාලාව සැකසී ඇත.

❖ සෑම වන්නමකම නාදමාලව තානම මගින් පිළිබිඹු වේ.

❖ එක් එක් වන්නම් සඳහා සාම්ප්‍රදායික බෙරපද ඇත.





## තුරඟා වන්නම

සිදුහත් බෝසතුන් ඡන්න ඇමති සමඟින් කන්ථක අසු පිට නැඟී ගිහි ගෙයින් නික්ම මහාභිනිෂ්ක්‍රමණය කළ ආකාරය පිළිබඳ මෙම වන්නමෙන් කිය වේ. තුරඟා යනු අශ්වයා වේ. අශ්වයාගේ ගමන් විලාසයට අනුව නාද මාලාවට සැකසී ඇත. සුළු මැදුම් දෙතිතට අයත් වන්නමකි.



## තුරඟා වන්නම

තාලය - සුළු මැදුම් දෙතිත මාත්‍රා ( 12/ 123 )

බෙරපදය - දොං ජිංත ගත දොංත

තානම -
තත් තත් තනත් තනෙන තත් තත් තනත් තනෙන
තත් තත් තනත් තම්ද නා නා
තන තනෙන තන තනෙන තතන නම් දන තනෙත
තානත් තනත් තම්ද නා නා

කවිය -
සත් වෙත් මහත් අදර ලත් යුත් සිදත් කුමරු
ගත් සිත් තොසත් පැවිදි අංගා
අණ කරන ඡන්නයෙන කන්තකය අසු ගෙනෙන
ගෙන යෙදුණ අසුගෙ පිට නැංගා

ගත් ගත් පයත් අසුගෙ ශබ්දත් වසත් සුරිඳු
යන්නෙන් තොසින් තිදෙන සමඟ
යන යනෙන කල තිදෙන එතැන තැන පසුව දැන
ගංතෙරට පත් උණිය එමඟා

ලත්ලත් සිතත් තිදෙන වෙත් වෙත් එකක් පසුව
මුත් කන්ථකත් වේ ය තුරඟා
සිදුහතුන ගෙන වහන ඡන්න වලිගය අතින
පැන්නෙන් එතෙර අනොම ගංගා

ගොත් සිත් මහත් රුසිරු ලත් යුත් සිදත් කුමරු
ගෙන් සෙත් රැගත් නෙර්ත අංගා
තිදෙන පැන ගිය ගඟින එතෙද අණ ගෙන බැතින
යෙදුව නැණ වර්ණයෙන තුරඟා

කස්තිරම -
කුඳ ගජිත කුඳ ගජිත කුඳ ගජිත කුඳ තා /// ( දකුණ සහ වම )
කුඳ ගජිත කුඳ තා //
කුඳ තා //
කුඳ ගජිත කුඳ ගජිත කුඳ ගජිත කුඳ තා

## කාර්ය පත්‍රිකාව

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න

01. වඳුරෙකුගේ හැසිරීම් රටාව පිළිබඳ කියවෙන වන්නමකි.
    1) තුරඟා  2) හනුමා  3) ගජගා  4) මුසලඬි

02. .උඩරට , පහතරට , සබරගමු සාම්ප්‍රදායන් 3හි වන්නම් ගණන පිළිවෙලින් ලියන්න
    1) 21 ,12 ,18  2)18 , 32 , 21  3) 18 , 21 , 32  4) 12 ,18 , 32

03. වන්නමකදී අවසානයේදී නර්තනය කරනුයේ
    1) තානම  2) අඩව්ව  3) කස්තිරම  4) සිරුමාරුව

04. සිද්ධාර්ථ කුමාරයාගේ අභිනිෂ්ක්‍රමණය පිළිබඳ කියවෙන වන්නමකි.
    1) හනුමා  2) මයුරා  3) තුරඟා  4) ගණපති

05. ගිරින් ගිරට පැන මෙම කවි පන්තිය අයත් වන්නේ
    1) හනුමා  2) මයුරා  3) තුරඟා  4) ගණපති

- . කවිය සම්පූර්ණ කරන්න

ගත් ගත් පයත් ...............ශබ්දත් වසත් .................
යන්නෙන් .....................තිදෙන සමඟ
.........................කල තිදෙන එතැන තැන පසුව දැන
ගංතෙරට පත් උණිය .....................

- වගුව සම්පූර්ණ කරන්න

| වන්නම | තිත | බෙර පදය |
|---|---|---|
| හනුමා | | |
| තුරඟා | | |

- උඩරට වන්නම් සම්බන්ධයෙන් පිළිතුරු සපයන්න

අරමුණ ...................................................
යුගය .......................................................
කුමන රජ කල ..........................................
ගායනා කල ස්ථානය .................................
රචකයා .....................................................

කවිකාර මඩුව  මහනුවර
ගණිතාලංකාර
විනෝදය  ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ

➢ පහත සඳහන් ප්‍රශ්නවල පිළිතුරු සඳහා ප්‍රශ්න අංකය යොදන්න.

➢ තිත් යා කර සැගවී ඇති රූපය සොයා ලියන්න............................




1. උදා - උඩරට නර්තනයේ මූලික අංගහාරය.
2. වන්නම් යන්නහි අරුත් දේ .
3. වන්නම් 18ක් දැකිය හැකි සම්ප්‍රදාය
4. මුල් කාලයේ වන්නම් රචනා වී ඇත්තේ කුමක් සඳහාද
5. උඩරට හා සබරගමු වන්නම් කුමක් අරභයා රචනා වුයේද,
6. වන්නම් 32 දැකිය හැක්කේ
7. උඩරට වන්නම් නර්තනයේදී වාදනය කරයි
8. මණ්ඩිය අතර පරතරය
9. 12/ 123 තිතට අයත් වන්නමකි.
10. පහතරට ප්‍රධාන වාද්‍ය භාණ්ඩය.
11. උඩරට වන්නම් රචනා කල යුගය
12. වන්නමකදී ගයනුයේ
13. වන්නම් 21 දැකිය හැකි සම්ප්‍රදාය
14. කඩිප්පුවක් අධාරයෙන් වාදනය කරයි.
15. වන්නමක අඩව්වට පෙර නටනුයේ
16. සීරුමාරුවට පෙර නටනුයේ

➢ නිවැරදි තාල රූපය අනුව වන්නම ගායනය කරන්න

➢ නියමිත අංගහාර සහිතව වන්නම නර්තනය කරන්න

| නර්තනය | | |
|---|---|---|
| 7 ශ්‍රේණිය | .11 වාරය - | |
| ගුරුභවතාගේ නම : කේ .ජී.නදීකා නිමාලි රාජපක්ෂ | | අම්/පරගහකැලේ ම.වි. |

නිපුණතාව : 5:.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැදි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම : . 5.1ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා බැදි සාරධර්මඅනුගමනය කරයි.

## නර්තන සම්ප්‍රදාය හා බැදි සාරධර්ම

අතීතයේ දී නර්තන අධ්‍යාපනයේ තක්ෂිලාව ගුරු ගෙදර වූ අතර එහි ශිල්ප ශාස්ත්‍රය හදාරන ශිෂ්‍යයින් (ආධුනිකයින්) ගුරුවරයාගේ අනුදැනුම ඇතිව ජන්ම පත්‍රය බලා සුදුසු හෝරාවකට අනුව දෙමාපිය අවසරයෙන් කළඑළි බැසීමට සුදුසුකම් ලබයි. ගුරු ඇසුර යටතේ ශිල්පය හදාරා ශිල්පීය ප්‍රවණතත්වයට පත් වූ පසු ඔහුන් ශිල්පීන් ලෙස සමාජ ගත කරන ලද්දේ සුවිශේෂ චාරිත්‍ර වාරිත්‍ර සමූහයක් පවත්වා විධිමත් ආකාරයෙනි.මෙසේ ප්‍රථම වරට ගුරුවරුන් ඉදිරියේ ඔවුන්ගේ ආශිර්වාදය මත තම ශිල්පීය ප්‍රාගුන්‍ය ප්‍රදර්ශනය කිරීම එක් එක් සම්ප්‍රදායන්හි විවිධ නම්වලින් හඳුන්වනු ලබයි.

- උඩරට නර්තන සම්ප්‍රදාය :- හිස වෙස් බැදීමේ මංගල්‍ය(ශීර්ෂාභරණ පැළඳවීමේ මංගල්‍ය)
- පහතරට නර්තන සම්ප්‍රදාය :- මඩු බැසීමේ මංගල්‍ය
- සබරගමු නර්තන සම්ප්‍රදාය :- ගුරු වරම් දීමේ මංගල්‍ය







එක් එක් සම්ප්‍රදායට අනුව කළඑළි බැසීමේ චාරිත්‍රයයන්හි ප්‍රායෝගික වශයෙන් වෙනස් කම් දක්නට ඇතත් එමගින් ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු වල පොදු සමාන බවක් දැකිය හැකිය.

## උඩරට හිස වෙස් බැඳීමේ මංගල්‍යය (ශීර්ෂාභරණ පැළඳවීම)

උඩරට නර්තන සම්ප්‍රදායේ දී ශිල්ප උගත් ආධුනික ශිල්පියා සමාජ ගත කිරීමට නැතහොත් සමාජයට ශිල්පියෙක් ලෙස හඳුන්වාදීමට මත්තෙන් ඔහුට වගකිම් පැවරීමට තරම් සුදුසු මට්ටමකට පත්ව ඇත්ද යන්නත් ඔහු ප්‍රමාණවත් පරිදි ශිල්ප ඥානය ලබා තිබේද යන්න පිළිබඳව ගුරුවරයා සෑහීමකට පත් විය යුතුය. කළඑළි බැසීමකදී ඒ බව අන්‍යයන් වෙත තහවුරු කිරීම සඳහා ගුරු ශිෂ්‍ය දෙදෙනාම වගකීමෙන් බැඳී සිටිය යුතුය.වෙස් බැඳීමටප්‍රථම ගුරු ගෙදර අධ්‍යාපනය නිමකරන ශිල්පියාගේ ජන්ම පත්‍රයට අනුව සුදුසු නැකතක් සකස් කර ගත යුතුය. හිස වෙස් බැඳීම සිදු කරනු ලබන්නෙ පුණ්‍ය භූමියක දීය. ඒ අනුව

- හිස වෙස් බැඳීමට තුන් මසක සිට පේ වීම
- නිවැසියන් සියළු දෙනාම මස් , මාංශ අනුභවයෙන් තොර වීම
- උදේ , හවස ස්නානය කර පිරිසිදු වී ආගමික වතවත් වල යෙදීම
- නැකත් දිනට ආසන්න දින හත විහාරස්ථානයේ ආගමික වතාවත් වලට සහභාගී වෙමින් අදාළ දෙවිවරු වෙනුවෙන් මල් පැළක් සකස් කර පහන් දල්වා ආශිර්වාද ලබා ගැනීම.
- හගළ පේ කිරීම
    - නැකැත් දිනට පෙර දින රාත්‍රියේ හගළ ඇතුළු රංග වස්ත්‍රාභරණ බුදුගේ මල් අසුන මත තබා පේ කර බෝධි පූජාවට සහභාගී වීම.
- හිස වෙස් බඳින දින පාන්දර ජාමයේ පිරුවට අන්දවා දිය කඩිත්තක් වෙතට ගෙන ගොස් කහ හා දෙහි උලා නාවා පිරිසිදු කර සුදුවතින් සරසා විහාර ගෙට කැදවාගෙන ඒම.
- එහිදී හගළ අන්දවා අවුල් හැර යොදා , බන්දි වළලු පලදා , රංග වස්ත්‍රාභරණයෙන් මූලික කොටස් අන්දවා සූදානම් කිරීම.
- වෙස් බඳින ස්ථානයට දෙමාපියන්ට හෝ අන් අයට පැමිණීම තහනම් ය.
- ආධුනුක ශිල්පීන් මල් අසුන ඉදිරියේ දණගසා විහාර ගෙට භික්ෂූන් වීකහන්සේ වැඩම කරවා පිරිත් සජ්ජායනය මැද්දේ නැකතට හිස මත ජටාව තබා හිස වෙස් පළඳවා අන් අයට දර්ශනය වීම වැළැක්වීම සඳහා සුදු රෙදි කඩකින් වසා බුදු ගෙයින් එළියට ගෙන ඒම.
- මිදුලේ තබා ඇති දිය කොරහට පඩුරක් දමා එයින් නැගෙන රැළිමතින් ආධුනික ශිල්පීන් ප්‍රථම වතාවට තමන්ගේ රුව දැකීමට සැලැස්වීම
- ඉන්පසු බෝධිය වෙත කැදවාගෙන ගොස් බෝධිය වටා තුන් වතාවක් පැදකුණු කොට දිය කළයක් නාවා , කිරි ගසක් වෙත කැදවාගෙන ගොස් කිරි ගසට කොටා එයින් වැහෙන කිරි බලා , කිරි හරකෙකු වෙත ගොස් වහන්තරාව ඔසවා කිරි හරකා දෙස බැලීමට සලස්වා , කැඩපතක් ලගට ගෙන ගොස් එයින් මුහුණ බැලීමට සලස්වා , විහාර මළුව වෙත කැදවා ගෙන ගොස් දාගැබේ කොත පෙන්වමින් වහන්තරාව ඉවත් කිරීම,
- වස් දොස් දුරු කිරීම සඳහා කළය බිදීම හා පොල් බිදීම සිදුකර රග මඩල වෙත කැදවාගෙන යාම,
- යහන ඉදිරියේ පූජා වට්ටි තැන්පත් කොට දෙවියන්ට කැප කිරීම,

- ගුරු දෙමාපියන් පා වැඳ ආශිර්වාද ලබා රඟුම් දැක්වීමට සූදානම් වීම,
- මංගලම් නර්තනයෙන් ආරම්භ කොට ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කිරීම.
- ආධුනික ශිල්පීන්ට තෑගි බෝග පිරිනැමීම.





**<u>පහතරට මඩු බැසීම හෙවත් කළඑළි බැසීම</u>**

පහතරට නර්තන ශිල්පය ප්‍රගුණ කළ ආධුනිකයෙකු තම දක්ෂතා ප්‍රදර්ශනය කරන අවස්ථාව මඩු බැසීම හෙවත් කළඑළි බැසීම නමින් හැඳින්වේ.

- මඩු බැසීම සඳහා මඩු යාගයක් කිරීම,
- කළඑළි බැසීම සඳහා යක් තොවිලයක් යොදා ගැනීම,

මඩු බැසීමේදී සිදුකරන චාරිත්‍ර ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි.

1. ආධුනිකයා කපු පත්තිනි කෙනෙක් නම් මඩු බැසීමේදී හලං වැඩමවා පත්තිනි නැටීම
2. ආධුනික ශිල්පියෙක් නම් වාහල නැටීම,

කළඑළි බැසීමේ චාරිත්‍ර

- ආධුනිකයා නර්තනයට පිවිසෙන අවස්ථාවේදී ගුරුවරයාට ගුරු පඩුරු හා තෑගි භෝග ප්‍රධානය කිරීම,
- මඩු යාගයේ අනෙක් නර්තන අවස්ථා සඳහා සහභාගී වීම,
- මාලක්කම් , බඹර වළල්ල ආදී සුවිශේෂී දක්ෂතා ඉදිරිපත් කිරීම,
- සියළුම නර්තන ශිල්පීන් සහභගී වීම හැන්දෑ සමයම නැමති නර්තන අවස්තාවේ දී ආධුනිකයාට සිය දක්ෂතා දැක්වීමට අවස්ථාව ලැබීම,



## සබරගමු ගුරුවරම් දීමේ මංගල්‍යය

ගුරු ගෙදර අධ්‍යාපනය නිම කරන ආධුනික ශිල්පියා ප්‍රවීනතාවයට පත් වූ විට ඔහුට ගුරු වරම් දීම සුදුසු යැයි ගුරුවරයා තීරනය කරයි. ශිල්ප ඥාණය ලැබ පරම්පරාවට ආවේණිකව පවත්වන ශාන්තිකර්මයක දී ගුරුවරම් ලබා දීම සූදානම් කිරීම සිරිතකි.

ගුරු වරම් ලබා දීම ආධුනිකයා ශිල්ප ලැබූ ගුරු පරම්පරාව අනුව ප්‍රධාන ආකාර තුනකට සිදු කරයි.

1. මඩු ශාන්ති කර්ම ගුරු පරම්පරාවකට අයත්නම් පහන් මඩුවේ දී ගුරුවරම් දෙයි,
2. යක් තොවිල් කරන ගුරු පරපුරකට අයත්නම් යක් තොවිලයලදී ගුරු වරම් දෙයි,
3. බලි ශාන්ති කර්ම සිදු කරන ගුරු පරම්පරාවකට අයත්නම් බලි ශාන්ති කර්මයකදී ගුරු වරම් ලබා දෙයි.

### ගුරුවරම් ලබාදීමේ චාරිත්‍ර

- ගුරුවරයා විසින් ආධුනික ශිල්පියාගේ දෙමාපියන් දැනුවත් කිරීම,
- සුභ නැකතට අනුව මඩුව පවත්වන දින සවස හගළ හා නෙත්ති මාලය (හිස පළඳනාව) පැළඳවීම
- පුවක් මල් කිනිත්තක් අතට දී ගුරුවරයා ආධුනිකයාගේ හිසමත අත තබා ගුරු වරම් දී අශිර්වාද කිරීම,
- ආධුනිකයාගේ මූලිකත්වයෙන් ශාන්ති කර්මයේ මූලික චාරිත්‍ර සිදු කිරීම,
    - කවි ගායනය , නර්තනය , සංවාද සහ යක් කවි අන්තර් ගත වේ.
- ශාන්ති කර්මය අවසානයේ ගුරුවරයා විසින් ආධුනිකයාට සෙත් කිරීම.
- ආධුනිකයාගේ දෙමාපිය , නෑදෑ හිත වතුන් ආශිර්වාද කර තෑගි භෝග පිරිනැමීම.



කාර්ය පත්‍රිකාව

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න,

1. නර්තන ශිල්පය ප්‍රගුණ කළ ආධුනිකයෙකු තම දක්ෂතා එළිදැක්වීම............. මංගල්‍ය නමින් හඳුන්වයි.
   (1ගුංගුරු (2කළඑළි (3සරණ මංගල්‍ය (4 කොටහළු මංගල්‍ය

2. වෙස් මංගල්‍යයේදී ශිල්පියා නොපෙනෙන සේ ආවරණය කරනු ලබන සුදු රෙද්ද හඳුන්වන්නේ

   (1කඩතුරාව නමිනි (2හගළ නමිනි 3 (උල්ඩය නමිනි (4 තෙල් කච්චිය නමිනි

3. මාලක්කම් හා බඹර වළල්ල වැනි සුවිශේෂතා දැකිය හැක්කේ

   (1සූනියම් මඩුවේදී (2වෙස් මංගල්‍යයේදී (3ගුරුවරම් දීමේදී (4 මඩු බැසීමේදී

4. මඩු ශිල්පියාට තම දක්ෂතා පෙන්විය හැකි නර්තන අංගයකි
   (1හැන්දෑ සමයම (2දෙවොල් නර්තනය (3මංගලම් නර්තනය (4 මුල් මාත්‍රය

5. වෙස් මංගල්‍යට පෙර මස් මාංශ අනුභවයෙන් තොරව කිළි දොස් වලින් ආරක්ෂා විය යුතු කාලය

   (1 මාස 1 (2 මාස 3 (3 මාස 6 (4 සති 3

- හිස්තැන් පුරවන්න

1. වෙස් මංගල්‍යට කියන තවත් නමකි .......................................... පැළඳවීමේ මංගල්‍යය.

2. ආධුනිකයෙකු කළඑළි මංගල්‍යට ප්‍රථම තම....................................... පරීක්ෂා කර බලා සුදුසු නැකතක් යොදා ගැනීම සිදු කරයි.

3. ආධුනික ශිල්පියෙකු නැකත් දිනට ආසන්න දින .................................... විහාරස්ථානයේ රැදී සිට ආගමික වතාවත් වල යෙදීම සිරිතකි.

4. මඩු බැසීමේදී ආධුනිකයා කපු පත්තිනි කෙනෙක් නම් .................................... වැඩමවා ........................... නැටීම කළ යුතුය

5. මඩුව පවත්වන දින සවස සුභ නැකතට අනුව හගළ හා ............................. පැළඳීම සබරගමු ගුරු වරම් දීම මංගල්‍යයේ චාරිත්‍රයකි.

- පිළිතුරු ලියන්න.

1. වෙස් මංගල්‍යය හා බැදි චාරිත්‍ර මොනවා ද?

2. පහතරට මඩු බැසීමේ දී සිදු කරනු ලබන චාරිත්‍ර කොටස් දෙක නම් කරන්න.

3. ගුරු වරම් දීමේ මංගල්‍යයේ චාරිත්‍ර මොනවා ද?

4. කළඑළි මංගල්‍යය සම්ප්‍රදායන් තුනට අනුව නම් කරන්න.

5. පහතරට මඩු බැසීම හා සබර ගමු ගුරු වරම් දීමේ මංගල්‍යය අතර සමාන අසමානත මොනවා ද?

නර්තනය

7 ශ්‍රේණිය. 11 - වාරය

ගුරුභවතාගේ නම : ඒ.වී.එස්.සී.ගුණසේකර අම්/අඹගහවැල්ල ම.වි.

නිපුණතාව : 6.0 රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි.

නිපුණතා මට්ටම : 6.4 විවිධ ජන වර්ග හා සබැඳි සංස්කෘතික උත්සව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි .

## රාමසාන් උත්සවය



- ලොවපුරා සිටින සියළු ඉස්ලාම් බැතිමතුන් ඉතා ගෞරවයෙන් “ඉල් උල් පිතර්” හෙවත් රාමසාන් උත්සවය සමරති .
- පවත්වන කාලය වන්නේ ජුනි මාසයේ නව සඳ බැලීමෙන් අනතුරුව ජූලි මාසයේ නව සඳ බැලිමෙන් පසුව රාමසාන් උත්සවය පවත්වයි.

- උත්සවය අරාබිය,මැලේසියාව,ඉන්දියාව,ශ්‍රී ලංකාව ආදී රටවල වෙසෙන (මුස්ලිම් ) ඉස්ලාම් බැතිමතුන්ගේ ප්‍රධාන උත්සවයකි.
- ඉස්ලාම් ආගමිකයන්ගේ ශුද්ධවූ ග්‍රන්ථය වන ‘’අල් කුරානය’’ ලොව පහළ වුණ කාලය සිහිපත් කිරීම මුල් කරගෙන උපවාශ සීලය ආරම්භ වේ.

- මුස්ලිම් ආගමික නීතිය අනුව සෑම ඉස්ලාම් භක්තිකයෙකුම අනිවාර්යෙන්ම රැකිය යුතු නෝම්බි ඇල්ලීම හෙවත් උපවාස සීලය මාසයක් පුරාම ආරක්ෂා කර අවසන් කරන දිනය රාමසාන් දිනය ලෙස හැඳින්වේ.




- අල් කුරානයට අනුව එකම අල්ලා දෙවියන් පිළිගත යුතුයි , දිනකට පස් වතාවක් එකම දෙවියන් නැමදීම , නැති බැරි අයට දන් දීම , උපවාසයේ යෙදීම,හජ්ජි පැවැත්වීම ආදිය මාසයක් පුරාම උපවාස සීලයෙහි පිළිපැදිය යුතුය.

- වයස අවුරුදු 7ට අඩු කුඩා දරුවන් ,වයස් ගත පුද්ගලයන් ,ශරීර ශක්තියෙන් දුබල රෝගී කණ්ඩායම් හැර අනික් සෑම කෙනෙක්ම මෙම ශීලය අනිවාර්යයෙන්ම පිළිපැදිය යුතුය.
- දිනපතා හිමිදිරි උදෑසන හිරු උදා වෙන්නට පෙර පළමු යාඥාවෙන් ආහාර අරගෙන උපවාශ ශීලය ආරම්භ කර නැවත හිරු බැස යන තුරුම කිසිම ආහාරයක් පානයක් කෙළ බිඳක්වත් නොගෙන සිදු කරයි.
- ආහාර ධන ධාන්‍ය ,වස්ත්‍ර,ඇඳුම් පැළැඳුම් ආදිය බෙදා ගැනීම. , බොරු නොකීම ,කායික සංවර බව, මානසික සංවර බව ආදිය ඇති කර ගැනීම මෙහි සුවිශේෂී යහපත් ගුණාංග වේ.




- සුවිශේෂී ලක්ෂණ
  - ➢ සමගිය වර්ධනය වීම.
  - ➢ සහජීවනය ඇති වීම

<u>කාර්ය පත්‍රිකාව</u>

➢ හිස්තැන් පුරවන්න.

1.රාමසාන් උත්සවය සමරනු ලබන්නේ ........................................................ ජාතීන්ය .

2. ආගමික නීතිය අනුව මෙම භක්තිකයන් අනිවයෙන්ම රැකිය යුතු ශීලය.......................................... නමින් හඳුන්වයි.

3.ඉස්ලාම් භක්තිකයන්ගේ ශුද්ධ වූ ග්‍රන්ථය ........................................................ නම් වේ.

4.මොවුන් අදහනු ලබන්නේ .................................................... දෙවියන් ය.

5.රාමසාන් උත්සවය .......................................... යන නමින්ද හැඳින්වේ .

➢ පිළිතුරු ලියන්න.

1. රාමසාන් උත්සවය පැවැත්වීමට මූලික වූ හේතුව සඳහන් කරන්න .
2. උපවාස ශිලය පවත්වන කාල වකවානු සඳහන් කරන්න .
3. උපවාස ශීලය පවත්වන (රකින) ආකාරය ලියා දක්වන්න .
4. රාමසාන් උත්සවය පවත්වනු ලබන රටවල් මොනවාද ?
5. උපවාස ශීලයට අවසර නොලැබෙන්නේ කාටද?
6. උපවාස ශිලය රැකීමෙන් බලාපොරොත්තු වන සුවිශේශී ලක්ෂන ලියන්න .
7. අල් - කුරානයේ සඳහන් පංචස් තම්භන නම් කරන්න .

නර්තනය

7 ශ්‍රේණිය.                111 - වාරය

ගුරුභවතාගේ නම: ආර්.එම්.සී. රාජපක්ෂ                කලාප අධ්‍යාපන කාර්යාලය, අම්පාර.

නිපුනතාව : 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි.

නිපුණතා මට්ටම: 1.2 භාව ප්‍රකාශනය වන පරිදි චරිත නිරූපනය කරයි.

## ‘ උත්සාහය ’ නමැති ස්ථායිභාවය නිරූපනය කරමු.

නර්තනයේ දී ශරීරයේ ප්‍රධාන අංග තුනක් වන අංග, උපාංග. ප්‍රත්‍යාංග යන කොටස් තුළින් මිනිස් සිතෙහි ඇති වන්නා වූ සිතුවිලි උද්දීපනය කරයි. මෙසේ කෙරෙන උද්දීපනයන් ක්‍රියාකාරකම් වේ. එම ක්‍රියාකාරකම් කිරීම සඳහා පහත සඳහන් අයුරින් ශරීරය මෙහෙයවයි.

අංග
ප්‍රත්‍යාංග
උපාංග
→
කාලය
වේගය
ශක්තිය
දුර
→
භාව
නිරූපණ





ඉහත රූපරාමුවට අනුව භාව නිරූපණ අවස්ථාවක් ලෙස “උත්සාහය” නමැති භාවය ඉදිරිපත් කිරීමේදී ශාරිරික විපර්යාසයන් පිළිබඳව විමසා බලමු.

- මස්පිඩු තද කිරීම
- ඇස් කුඩා කිරීම
- කම්මුල් දෙපසට විහිදීම
- තොල් තදින් හකුලා ගැනීම
- දත් ඇදි එකට තද කිරීම

} යම් පුද්ගලයෙකු කිසියම් දෙයක් කිරීමට උත්සාහ ගැනීමේදී දැකිය හැකියි.

මෙසේ 'උත්සාහය' නමැති භාවයන් තුළින් මතු වන්නා වූ රසය "වීර" රසය ලෙස රසයන් පිළිබඳ හඳුන්වාදෙන භරතමුණිවරයාගේ නාට්‍ය ශාස්ත්‍රය ට අනුව හඳුන්වා දී ඇත.

## කාර්ය පත්‍රිකාව

1. 'උත්සාහය' නමැති ස්ථායි භාවය තුළින් මතුවන්නා වූ රසය වන්නේ,
   1. හාස්‍ය රසයයි. 2. වීර රසයයි. 3. උත්සාහ රසයයි. 4. භාව රසයයි.
2. ශරීරයේ අංග,ප්‍රත්‍යාංග. උපාංග කොටස් වලින් නිරූපණය වන්නේ,
   1. භාව යයි 2. චලනයයි. 3. නර්තනයයි 5. වේගයයි
3. ස්ථායි භාවයන් නිරූපණය වන ක්‍රියාකාරකම සඳහා ශරීරය මෙහෙයවීමේදී අවධාරණය වන කරුණක් වන්නේ,
   1. අංග , උපාංග 2. වේගය , ශක්තිය 3. භාව , විභාව 4. මස්පිඬු , තොල්
4. වීරත්වය නිරූපණයට , පෙන්නුම් කිරීමට ගත හැකි ක්‍රීඩාවකි.
   1. පනා හැංගීම 2. පංච දැමීම 3. කඹ ඇදීම 4. එළුවන් කෑම
5. උත්සාහ භාවය තුලින් ,
   1. සතුටු විය හැකිය. 2. ජය ගත හැකිය. 3. පුදුම විය හැකිය. 4. පැරද විය හැකිය.

❖ කෙටියෙන් පිළිතුරු සපයන්න.

1. භාව ප්‍රකාශනයේදී ශරීරය බෙදෙන ප්‍රධාන කොටස් 3 ක් නම් කරන්න.
2. 'උත්සාහය' නමැති ස්ථායි භාවය නිරූපනයේදී ඇති වන රසය කුමක්ද?
3. උත්සාහ භාවය නිරූපණයේදී ශරීරය තුළින් දැකිය හැකි ලක්ෂණයන් 4 ක් ලියන්න.
4. මිනිසකු තුළින් උත්සාහය දැනවිය හැකි අවස්ථා තුනක් ලියන්න.
5. මෙම භාවය නිරූපණයට සුදුසු සිද්ධියක් කෙටියෙන් ලියා දක්වන්න.

නර්තනය

7 ශ්‍රේණිය. 111 - වාරය

ගුරුභවතාගේ නම : Y.G.U.S. රාජපක්ෂ අම්/සද්ධාතිස්ස මහා විද්‍යාලය

නිපුණතාව : 4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැදි ගායනා වල පසුබිම අධ්‍යයනය කරමින් ගායනා කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 4.1 නිර්දේශිත ගායනාවල සාමාජීය හා සංස්කෘතික පසුබිම විස්තර කරයි.

## මල් යහන් කවි හා බැඳි සමාජ සංස්කෘතික පසුබිම

ඕනෑම සමාජයක සුභ කටයුත්තක් ආරම්භයේ දෙවි දේවතාවුන්ගෙන් ආශිර්වාද ලබා ගැනීම සිරිතකි. ඒ නිසාම කරදරයක්, අපල උපද්‍රවයක්, අස්වැන්නේ අඩු වීමක් සිදු වුවද දෙවියන්ගේ පිහිට ලබා ගැනීමේ අරමුණින් බොහෝ ශාන්ති කර්ම සිදු කරන අතර එහි මූලික අරමුණ වන්නේ දෙවි දේවතාවන්ට පුදසෙත් ලබා දී පිහිට, ආශිර්වාදය ලබා ගැනීමයි.




මේ නිසා යහනට දෙවියන්ට වඩින ලෙස ආරාධනා ස්වරූපයෙන් ගායනා කරනු ලබන කාව්‍ය විශේෂය "මල් යහන් කවි" යනුවෙන් හැදින්වේ. මෙම කවි උඩරට , පහතරට, සබරගමු යන ත්‍රිවිධ සම්ප්‍රදායෙහිම දක්නට ලැබේ.

ප්‍රාදේශීය විවිධත්වය අනුව පුද ලබන දෙවියන් මුල් කොට ගෙන මෙම ගායනා ඉදිරිපත් කරයි. සම්ප්‍රදායන්ට අනුව ගායනයේ නාද මාලාවන්හි යම් යම් වෙනස් කම් දක්නට ලැබේ.

කොහොඹා කංකාරි ශාන්ති කර්මයේදී මල් යහන් කවි ගායනයේ මූලික අරමුණ දෙවියන් ඔවුන් සඳහා පිළියෙල කෙරුන මල් යහනට කැඳවීමයි. මෙහිදී ගායනා කරන මල් යහන් කවි වලින් හෙලි වන කරුණු අනුව බෞද්ධයන්ගේ පූජනීය අවස්ථාවල සිටින දෙවිවරුන් පමණක් නොව සීනිගම, දෙවින්දර හා කතරගම දෙවිවරුනුත් කොළඹ, වත්තල, මෝදර ආදි පළාත් වල දෙවිවරුනුත් මෙම මල්යහන් වලට ගෙන්වා ගන්නා බවයි. දෙවි වරුද මෙහිදී නම් වශයෙන් ඇරයුම් ලබති. උඩුවේරිය , ඉරුගල්බණ්ඩාර , කන්දෙ දෙවි යනාදි වශයෙනි.

ඒ අනුව මල් යහන් කවි ගායනා කරන අවස්ථා,



* ශාන්ති කර්මවලදී
* අපල උපද්‍රව අවස්ථාවලදී
* ගෙපලක් කපන අවස්ථාවේදී
* කිරි අම්මා වරුන්ගේ ශාන්ති කර්මයේදී
* වෙල් දාන අවස්ථාවේදී



ඇතැම් අවස්ථා වලදී මල් යහන සඳහා සුදු පිරුවටයක් එලා සකස් කර ගත් පුටුවක් භාවිතා කරන අවස්ථා දක්නට ලැබේ. විශේෂයෙන්ම ඇප නූල් , යන්ත්‍ර ආදිය දමන අවස්ථාවලදී මෙවැනි ආකාරයේ මල් යහන් සකස් කර ගනු ලබයි.

## මල් යහන් කවි



| | |
|---|---|
| මිහින්තලය අට සැට ලෙන සේල චෛත්‍ය | වෙහෙරට |
| අඹතලාව මිරිසවැටිය භයාගිරිය නම් | වෙහෙරට |
| ජය ශ්‍රී මහ රුවන්වැලිය ථූපාරාමය | වෙහෙරට |
| අටමස්ථානයේ සිටියත් වඩින්න දෙවි මල් | යහනට |



| | |
|---|---|
| පුටුව සරසලයි මම සැල | කරන්නේ |
| පුටුවේ තියෙන දළු බුලතුයි | පුදන්නේ |
| කැටුව සිව් වරං සමගින් | බලන්නේ |
| ශ්‍රියා දේවි මල් අස්නට | වඩින්නේ |

කාර්ය පත්‍රිකාව

- පහත වාක්‍ය හරිනම් (✓) ලකුණද වැරදි නම් (✗) ලකුණද යොදන්න.

1. මල් යහන් කවි ශාන්ති කර්ම තුලදී පමණක් දක්නට ලැබේ. ( )
2. සම්ප්‍රදායන් තුනෙහිම මෙම කවි දක්නට නොලැබේ. ( )
3. මල් යහන් කවි දෙවියන්ට මල් යහනට වඩින ලෙස කරන ආරාධනාත්මක කවි විශේෂයකි. ( )
4. ඉරුගල් බණ්ඩාර දෙවි කුල ගෙවල් වලට අධිපති දෙවි කෙනෙකි. ( )
5. මල් යහන ගොක් කොළ කෙසෙල් පතුරු යොදා සකස් කර ගනු ලැබේ. ( )
6. “ පුටුව සරසලයි මම සැල කරන්නේ “ සිරසපාද කවියකි. ( )

- පහත වාක්‍ය කියවා හිස්තැන් පුරවන්න.

(1) ......................................................... ශාන්ති කර්ම වලදී අසන්නට ලැබේ.

(2) මල් යහන් කවි .................................................. ගායනා විශේෂයකි.

(3) මල් යහන් කවි මගින් මූලිකව ............................................................ ආරාධනා කරයි.

(4) “ පුටුව සරසලයි මම සල කරන්නේ “ ....................................................... කි.

- පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. මල් යහන් කවි වල අරමුණ පැහැදිලි කරන්න.

02. මල් යහන් කවි ගායනා කරන අවස්ථා සඳහන් කරන්න.

03. ඔබ දන්නා මල් යහන් කවියක් ලියන්න.

04. මල් යහන සඳහා ආරාධනා කරනු ලබන්නේ කුමන ස්ථානවල සිටින දෙවි දේවතාවන් හටද?

නර්තනය

7 ශ්‍රේණිය. 111 - වාරය

ගුරුභවතාගේ නම : H.M. නදීකා ශිරෝමි අම්/සේනාගම මහ විද්‍යාලය

නිපුණතාව : 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම - 5.2 ශ්‍රී ලාංකීය නර්තන සම්ප්‍රදාය හා සබැඳි තොරතුරු ඉදිරිපත් කරයි.

**ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ශාන්තිකර්මය ( උඩරට කොහොඹා යක්කංකාරිය)**

## ශාන්තිකර්ම යනු:-

ශාන්තිකර්ම යනු කිසියම් පුද්ගලයෙකුගේ මානසික හෝ කායික හෝ සුභසිද්ධිය අරමුණු කොට දෙවියන් යක්ෂයන් නැතහොත් වෙනත් බලවේග දුරු කර ශාන්තියක් උදෙසා පවත්වන කිසියම් කාර්ය සංසිද්ධියකි.

උඩරට කොහොඹා කංකාරි ශාන්ති කර්මය පැවැත්වීමට හේතු වූ කරුණු

### අතීතයේ පැවැත්වීමට හේතුව

- පඬුවස්දෙව් රජුට වැදුණු දිවිදොස් නිසා හටගත් රෝග සුවපත් කිරීම.

### වර්තමානයේ පැවැත්වීමට හේතු

- අස්වැන්න සරු කර ගැනීම.
- රෝග උපද්‍රව වලින් මිදීම.
- සෞභාග්‍ය හා සශ්‍රීකත්වය පතා
- ස්වභාවික විපත් වලින් ආරක්ෂා වීම.
- ග්‍රහ අපල වලින් ආරක්ෂා වීම.
- අධ්‍යාපනික අවශ්‍යතා හා පර්යේෂණ සඳහා

පුද ලබන දෙවිවරු

- කොහොඹා දෙවි තුන් කට්ටුව
- බණ්ඩාර දෙවි හත් කට්ටුව
- වීරමුණ්ඩ දෙවි
- කඩවර යකුන්
- වැදි යකුන්
- මෙලෙසයි යකුන්, රුක්පා යකුන්




ප්‍රචලිත ප්‍රදේශ

- මහනුවර,
- උඩුනුවර ,
- හාරිස්පත්තුව,
- හේවාහැට,
- යටිනුවර,
- සත් කෝරළය,
- සතර කෝරළය

## පුරාවෘත්තය

විජය රජු කුවේණිය සරණ පාවා ගැනීමෙන් අනතුරුව ඔවුන්ට දරුවන් දෙදෙනෙක් ලැබිණ. විජය කුවේණී පලවා හැර සම කුල කාන්තාවක් විවාහ කර ගත් නිසා කුවේණිය විජය ට සාප කරන ලදී. එම ශාපය විජයගෙන් පසුව රජ වූ පඬුවස්දෙව් රජුට වැළඳුණි.පඬුවස් දෙව් රජු දිවි දෝෂයකින් රෝගාතුර විය. එම රෝගය සුව කිරීමට මලය කුමාරවරුන් විසින් රජුට ශාන්තිකර්මයක් කරන ලදී.එම ශාන්තිකර්මය කොහොඹාකංකාරිය නමින් ප්‍රචලිත විය.

## ප්‍රධාන ඇඳුම් කට්ටලය

වෙස් ඇඳුම් කට්ටලය



## ප්‍රධාන වාද්‍ය භාණ්ඩය

ගැට බෙරය



සැරසිලි අංග



අත්‍යා බෙර වාදන අවස්ථාවක්



| ශාන්තිකර්ම හා සබැඳි නර්තනය, ගායනය, වාදනය, චාරිත්‍ර විධි සහ සැරසිලි (උඩරට) | | | | | | |
|---|---|---|---|---|---|---|
| ශාන්ති කර්ම | චාරිත්‍ර විධි | නර්තන අංග | ගායනය | වාදනය | සැරසිලි | නාට්‍යමය අවස්ථා |
| • කොහොඹා කංකාරිය | • කප් සිටුවීම<br>• මඩුව සැදීම<br>• මඩු පේ කිරීම<br>• තොට පේ කිරීම<br>• මල පේ කිරීම<br>• ආභරණ වැඩමවීම<br>• මල්යහන් කවි හා දෙවියන් පේ කිරීම | • යක් ඇන්නුම<br>• අස්නෙ<br>• ආවැන්දුම<br>• හත්පද<br>• දුනුමාලප්පුව<br>• කොහොඹා හැල්ල<br>• යක්තුන් පදය<br>• හත් පදය<br>• දාන පහ<br>• මඩුපුරය | • නමස්කාර<br>• අෂ්ටක<br>• ශ්ලෝක<br>• සන්න<br>• සැහැලි<br>• යාදිනි<br>• සිරසපාද<br>• කඩතුරා<br>• කෝල්මුර<br>• උපත් කවි | • නර්තනය සඳහා කෙරෙන වාදනය<br>• ගායනය සඳහා පමණක් යෙදෙන වාදනය<br>• මගුල් බෙර වාදන<br>• පිං බෙර<br>• වැඳුම් අත්<br>• දැකුම් අත් වාදනය | • මඩුව වටා ගොප්කොළ සැරසිලි වලින් අලංකාර කරනු ලැබේ.පොදුවේ ගත් කල කෙසෙල් පතුරු ගොප්කොළ අමුද්‍රව්‍ය ලෙස යොදා ගනියි. ලී කෝටු, පට්ටා, කෙසෙල් කොළ, හබරල කොළද භාවිතා කරයි. රංග භාණ්ඩ නිර්මාණය ද සැරසිලි සඳහා යොදා ගනු ලැබේ. | • යක්කම<br>• ගුරුගේ මාලාව<br>• ගබඩා - කොල්ලය |

නර්තන අවස්ථාවකි.



කාර්ය පත්‍රිකාව

1. උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්තිකර්මය වනුයේ

   1. දෙවොල් මඩුව 2. පහන්මඩුව

   3.කොහොඹා යක් කංකාරිය 4. කිරිමඩුව

2. කොහොඹා යක් කංකාරි ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණක් නොවන්නේ.

   1. සශ්‍රීකත්වය ලගා කරගැනීම 2. අස්වනු සරුසාර කරගැනීම

   3. වසන්ගත උවදුරු මර්දනය 4. දරුඵල අපේක්ෂාව

3. කොහොඹා යක් කංකාරි ශාන්තිකර්මය ප්‍රචලිත ප්‍රදේශ වනුයේ

   1. ගාල්ල, මාතර 2. උඩුනුවර, හාරිස්පත්තුව

   3. රත්නපුර, බලන්ගොඩ 4. සතර කෝරළය, මාතර

4. කොහොඹා යක් කංකාරි ශාන්තිකර්මයේ පුදලබන දෙවිවරු වන්නේ

   1. කොහොඹාදෙවි තුන් කට්ටුව, වීරමුණ්ඩ 2. රුප්පායකුන්, දෙවොල්දෙවි

   3. පත්තිනි දෙවි, දෙවොල් දෙවි 4. අමරාපති, හිරුරැස් සාමි

5. කොහොඹා යක් කංකාරි ශාන්තිකර්මයේ ප්‍රධාන ඇදුම්කට්ටලය හා ප්‍රධාන වාද්‍යය භාණ්ඩය වනුයේ.

   1. තෙල්මේ ඇදුම, යක්බෙරය 2. වෙස් ඇදුම, ගැටබෙරය

   3. පබළු ඇදුම, දවුල 4. වෙස් ඇදුම, තම්මැට්ටම

6. කොහොඹා යක් කංකාරි ශාන්තිකර්මයේ පුරාවෘත්තය වනුයේ

   1. මළය රජුගේ දිවි දෝෂය 2. සේරමාන් රජුගේ කතා පුවත

   3. පත්තිනි පාළඟ කතා පුවත 4. පඩුවස්දෙව් රජුගේ දිවි දෝෂය

7. කොහොඹා යක් කංකාරි ශාන්තිකර්ම පුරාවෘත කතාවේදී හමුවන චරිතයන් වන්නේ

   1. පත්තිනි,සේරමන්,රාහු අසුරේන්ද්‍රයා 2. කුවේණි,රාහු අසුරේන්ද්‍රයා,මළය රජු

   3. දෙවොල්,පත්තිනි,විජය රජු 4. සඳළිදු, හිරුරැස් සාමි, සක්‍රදෙවි

8. කොහොඹා යක් කංකාරි ශාන්තිකර්මයේ චාරිත්‍ර විධියක් නොවන්නේ.

   1. කප්සිටුවීම 2. අක්යාල වෙන්කිරීම 3. මඩුපේ කිරීම 4. මිල්ල කැපීම

9. පඩුවස් දෙව් රජුට වැළඳි රෝගය .......................... නම් වේ.

10. මෙම ශාන්ති කර්මයේ .............................. නාට්‍යමය අවස්ථාවකි.

11. ශාන්ති කර්මයක් යනු කුමක් ද?

12. කොහොඹා යක් කංකාරි ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු මොනවා ද?

13. මෙම ශාන්තිකර්මයේ පුරාවෘත්ත කතාව කෙටියෙන් ලියන්න.

14. මෙම ශාන්ති කර්මයේ නර්තන අංග නම් කරන්න.

15. මෙම ශාන්ති කර්මයේ සැරසිලි අංග සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය මොනවා ද?

නර්තනය

7 ශ්‍රේණිය .111 වාරය -

ගුරුභවතාගේ නම : කේ .ජී.නදීකා නිමාලි රාජපක්ෂ අම්/පරගහකැලේ ම.වි.

නිපුණතාව 5.0. ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම 5.3: .ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය ප්‍රවර්ධනයට දායක වූවන් අගයමින් .තොරතුරු ඉදිරිපත් කරයි

## නර්තන ශිල්පීන් අගයමු

### රද්දැල්ලේ පොඩි මහත්තයා ගුරුතුමා



- සබරගමු නර්තන ශිල්පියකු වන රද්දැල්ලේ පොඩි මහත්තයා, පරංගියා වත්තේ පොඩි මහත්තයා යන නමින්ද හැඳින්වේ. ඔහුගේ පරපුර වන්නේ පරංගියා වත්තේ රද්දැල්ලේ පරපුර යි. මෙතුමා ශිල්ප ඥානය ලැබුවේ තම පියාණන් වූ රද්දැල්ල ගම්මැදි රාලලාගේ වන්දන හාමි වන තම පියාගෙනි. මුල් යුගයේ ශාන්තිකර්ම හා විහාරස්ථානවල පැවති පින්කම් සඳහා පමණක් සීමා වී තිබූ සබරගමු නර්තනය ප්‍රාසාංගික කලාවක් ලෙස සංවර්ධනය කරා පිය නැගීමේදී සුවිසල් මෙහෙවරක යෙදුණු පුරෝගාමියෙක් ලෙස මෙතුමා හඳුන්වාදිය හැක.

### මෙතුමාගෙන් සිදුවූ සේවාවන්

- 1944 වර්ෂයේදී සබරගමු නර්තනය ඉගැන්වීමට කලායතනයක් ආරම්භ කිරීම.
- 1959 වර්ෂයේදී දික්වැල්ල මහා විද්‍යාලයේ නර්තන ගුරුවරයෙක් ලෙස කටයුතු කිරීම.
- 1964 දී ගිරාගම ගුරු විද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු ලෙස සේවයට බැඳී අමතර කාලයද යොදාගනිමින් සබරගමු නර්තනය ඉගැන්වීම සඳහා කැපවී කටයුතු කිරීම.
- 1977 සිට 1990 දක්වා සෞන්දර්ය අධ්‍යන ආයතනයේ කථිකාචාර්යවරයෙකු ලෙස කටයුතු කළ අතර සිසුන් එකතු කරගනිමින් ප්‍රාසාංගිකව ඉගැන්වීම් කටයුතු සිදුකර සිසුන් වැඩි පිරිසක් නර්තන අධ්‍යාපනයට යොමු කිරීම.
- පාසලට, ගුරු විද්‍යාලයට, විශ්වවිද්‍යාලෙට පමණක් සීමා නොවී හැකි සෑම අවස්ථාවකම පහන් මඩු, ගම්මඩු ශාන්තිකර්ම වල නර්තනයේ යෙදීම.
- සබරගමු නර්තනයෙහි ඇතැම් ගොරහැඩි චලන වඩාත් යෝග්‍ය ආකාරයෙන් සකස් කර ප්‍රාසාංගික නර්තන අංගයක් වශයෙන් නූතන වේදිකාවට ගෙන ඒමට අවශ්‍ය පසුබිම සකස් කිරීම.
- සබරගමු නර්තන විෂයමාලා සකස් කිරීමට මූලිකත්වය ගෙන කටයුතු කිරීම.

ඉහත සේවය ඇගයීම් සඳහා 1984දී කලා භූෂණ සම්මානයෙන් පිදුම් ලැබූ මෙතුමා නර්තන ශිල්පියකු, සාම්ප්‍රදායික ශාන්තිකර්ම ඇදුරකු පමණක් නොව කෘතහස්ත ගුරුවරයකු වශයෙන් ද පුරෝගාමී මෙහෙවරක යෙදුණු පුද්ගලයෙක් ලෙස පෙන්වා දිය හැකිය.

## ජේ. ඊ. සේදරමන් ගුරුතුමා



- 1908 සැප්තැම්බර් මස තුන්වන දින මහනුවර පූජාපිටිය ගම්මානයේ උපත ලැබූ මෙතුමා දක්ෂ උඩරට නර්තන ශිල්පියෙකි. සිය පියා වූ මාදන සිරිසේන ගුරුතුමාගෙන් උඩරට නර්තනය, බෙර වාදනය, චිත්‍ර ශිල්පය මෙන්ම මූර්ති ශිල්පයත්, අප්පු නයිදේ ගුරුතුමාගෙන් ජොතිෂ්‍ය විද්‍යාව හා නක්ෂත්‍රයත් ,පන්සල ආශ්‍රයෙන් සිංහල, පාලි, සංස්කෘත භාෂා හා කාව්‍ය කරණයත් උගත් මෙතුමා දක්ෂ කලාකරුවෙකි.

## ජේ.ඊ සේදරමන් ගුරුතුමාගෙන් සිදු වූ සේවාවන්

- **විදෙස් සංචාර වල යෙදෙමින් නර්තනයේ යෙදීම.**
    - 1930 වර්ෂයේ දී ප්‍රංශය බලා ගිය මෙතුමා සර්කස් කණ්ඩායමකට බැඳී නර්තනය ඉදිරිපත් කිරීම.
    - ජර්මනිය ,බෙල්ජියම, ස්විස්ටර්ලන්තය, හන්ගේරියාව, ඉතාලිය, එංගලන්තය වැනි රටවල සංචාරය කරමින් නර්තනයේ යෙදීම.
    - එංගලන්ත සංචාරයේදී රාගිනි දේවිය සමග රාධා ක්‍රිෂ්ණා සහ නාග නර්තනය ඉදිරිපත් කිරීමට මෙන්ම ඇගේ නර්තන වැඩසටහන් වල නර්තනාංග හයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම.
    - ඔහු විසින් ලියන ලද "සුන්දර යුරෝපය" නම් කෘතියේ රාවණා නෘත්‍ය යක් ඉදිරිපත් කර ඇති බව සඳහන් වේ.
    - සංචාරක නැටුම් කණ්ඩායමක් සකස් කර ප්‍රේක්ෂකයන් ඉදිරියේ රූගුම් දැක්වීම
    - සර්කස් වල හා ප්‍රදර්ශන වල රංගන කටයුතු ඉදිරිපත් කිරීම.
- **අධ්‍යාපන ක්ෂේත්‍රයේ සඳහා සේවය කිරීම**
    - 1941 ජූනි පළවෙනි දින ගුරුවරයකු ලෙස මුල්ම පත්වීම ලබා ගනිමින් මාවතගම මහා විද්‍යාලයේ උඩරට නර්තනය විෂයක් ලෙස ඉගැන්වීම.
    - ගිරාගම, පේරාදෙණිය, පොල්ගොල්ල, මීරිගම, නිට්ටඹුව යන ගුරු අභ්‍යාස විද්‍යාලවල නැටුම් හා සංගීත පරීක්ෂකවරයකු ලෙස සේවය කිරීම.
    - ගිරාගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ නැටුම් හා සංගීත කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කිරීම.
- **උඩරට නර්තන කලාව පිළිබඳ මුද්‍රිත ග්‍රන්ථ නොතිබූ යුගයක ඒ පිළිබඳ ග්‍රන්ථ රාශියක් රචනා කිරීම.**
    - සිංහල නාට්‍ය කලාව 1944
    - නෘත්‍ය චින්තාමණී 1949
    - උඩරට නැටුම් කලාව 1962

- ශ්‍රී ලංකාවේ යක්ෂ යුගය හෙවත් කොහොඹාකංකාරි උපත 1955
- නෘත්‍ය රත්නාකරය 1959
- ශුභ ශාන්ති විදි නොහොත් ලංකාවේ බලි උපත 1964
- බලියාග විචාරය නොහොත් ලංකාවේ බලි උපත 1967

- **මුද්‍රා නාට්‍ය කෘති නිර්මාණය කිරීම**
  - පණ්ඩුකාභය
  - තේලපත්ත
  - විජය කුවේණි
- **කලාත්මක කටයුතු සඳහා සංවිධාන පිහිටුවීම**
  - ලංකා මහජන කලා මණ්ඩලය
  - රාවණ කලා සංගමය.

උඩරට නර්තන කලාව පිළිබඳ ග්‍රන්ථ රාශියක් රචනා කරමින් එහි උන්නතිය සඳහා මෙතුමා සුවිසල් මෙහෙවරක් ඉටු කර ඇත .

## එච්. එම්. ගෝමිස් ගුරුතුමා

එච්. එම්. ගෝමිස් හෙවත් පොල්වත්තේ ගෝමිස් ගුරුතුමා පහත රට නර්තන කලාව ප්‍රාසාංගික කලාවක් වශයෙන් ජනප්‍රිය භාවිතයයේ නොතිබුණු වකවානුවක එකී කලාව ජාතික මෙන්ම ජාත්‍යන්තර තලයට ගෙන ඒමේ කාර්යභාරයේ ප්‍රමුඛ මෙහෙවරක් ඉටුකළ අතිවිශිෂ්ට පහතරට නර්තන ශිල්පියෙක් ලෙස හඳුන්වා දිය හැකිය. ශාන්තිකර්ම ශිල්පය හා මන්ත්‍ර ශාස්ත්‍රය මැනැවින් ප්‍රගුණ කර සිටි මෙතුමා පහතරට නර්තන සම්ප්‍රදායේ මාතර ශෛලියේ නර්තන ශිල්පියෙක් ලෙස හැඳින්විය හැකිය.

- **මෙතුමාගෙන් පහතරට නර්තන සම්ප්‍රදායට සිදු වූ සේවාවන් අතර**
  - රට යකුම හෙවත් රිද්දි යාගය,සූනියම් කැපිල්ල,මහසෝන් සමයම ,වැනි ශාන්ති කර්ම පිළිබඳ පුළුල් දැනුමක් මෙතුමා සතුවීම.
  - නාග කන්‍යා, ගිනි සිසිල, පන්දම් පාලිය වැනි නර්තනාංග නිර්මාණය කිරීම.
  - කෝලම් නාටකයේ එන අති මානුෂ චරිතයක් වන නාග කන්‍යා නැටුම ඉතා සිත් ගන්නා සුළු ආකාරයට නිර්මාණය කරමින් වේදිකාවට උචිත ලෙස රංග වින්‍යාසය කිරීම.
  - පහතරට නර්තනය වේදිකාවට උචිත ලෙස සකස් නොවී තිබූ අවධියක එය ක්‍රමවත්ව සකස් කිරීම.
  - සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ බාහිර කථිකාචාර්යවරයකු වශයෙන් වසර ගණනාවක් සේවය කිරීම.

ලෝකයේ රටවල් ගණනාවකම තමන්ගේ නර්තන හැකියාවන් ප්‍රදර්ශනය කළ මෙතුමා අන්තර්ජාතික වශයෙන් සම්මානයට පාත්‍ර වී ඇත. ගෝමිස් ගුරුතුමා අප අතරින් සමුගෙන වසර ගණනාවක් ගත වී ඇතත් එතුමාගේ නිර්මාණ කිසිදිනක ප්‍රේක්ෂකයින්ගෙන් සමුගැනීමක් සිදු නොවෙනු ඇත.

## කාර්ය පත්‍රිකාව

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

1. උඩරට නැටුම් කලාව කෘතිය රචනා කරන ලද්දේ

    1) ජේ. ඊ. සේදරමන් මහතා　　2) සව්රිස් සිල්වා මහතා

    3) කේ එස් ප්‍රනාන්දු මහතා　　4) රද්දැල්ලේ පොඩි මහත්තයා

2.ගෝමිස් ගුරු මහතා විසින් වේදිකාවට ගැළපෙන ලෙස නිර්මාණය කරන ලද නර්තනාංගයක් නොවන්නේ

    1) නාරිලතා　2) ගිනි සිසිල　3) නාග කන්‍යා　4) පන්දම් පාලිය

3. ජේ.ඊ. සේදරමන් ගුරුතුමා විසින් නිර්මාණය කරන ලද මුද්‍රා නාට්‍යයක් වන්නේ

    1)පණ්ඩුකාභය　2) කරදිය　3) කුඹි කතාව　4) තිත්ත බත

4. සබරගමු නර්තන විශ්වය මාලා සකස් කිරීමේ ගෞරවය හිමි වන්නේ

    1)පණීභාරත මහතා　　2) සව්රිස් සිල්වා මහතා

    3) කේ එස් ප්‍රනාන්දු මහතා　　4) රද්දැල්ලේ පොඩි මහත්තයා මහතා

5. ජෙ.ඊ. සෙ දරමන් ගුරුතුමා කාව්‍යකරණය ඉගෙන ගත්තේ

    1)පියාගෙන්　2) අප්පු නයිදේ ගුරුතුමාගෙන්　3) පාසලෙන්　4) පන්සලෙන්

- හිස්තැන් පුරවන්න

1. රද්දැල්ලේ පොඩි මහත්තයා ගුරුතුමා.............................. වත්තේ පොඩි මහත්තයා යන නමින් ද හැඳින්වේ
2. 1930 වර්ෂයේදී ප්‍රංශය බලාගොස් සර්කස් කණ්ඩායමකට බැඳුණේ............................ මහතාය.
3. පහතරට නර්තන සම්ප්‍රදායේ....................... ශෛලියේ නර්තන ශිල්පියෙක් ලෙස ගෝමිස් මහතා හැඳින්විය හැක.
4. ගෝමිස් මහතා නිර්මාණය කළ නර්තනාංග ලෙස නාග කන්‍යා,................. පන්දම් පාලිය පෙන්වා දිය හැක.
5. රද්දැල්ලේ පොඩි මහත්තයා ගුරුතුමා ගිරාගම ගුරු විද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු ලෙස සේවයටබැඳුනේ....................... වර්ෂයේදීය

- පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1. ඉහත නර්තන ශිල්පීන් තිදෙනා දක්ෂතා දැක්වූ නර්තන සම්ප්‍රදාය කුමක් දැයි ලියන්න.
2. ඔහුන් විසින් අධ්‍යාපනය සඳහා සිදුකර ඇති සේවාවන් දෙක බැගින් ලියන්න.
3. ජේ ඊ සේදරමන් ගුරුතුමා සංචාරය කර ඇති රටවල් මොනවාද?
4. ගෝමිස් ගුරුතුමා දක්ෂතා දැක්වූ ශාන්තිකර්ම නම් කරන්න.
5. සුන්දර යුරෝපයේ නම් කෘතියේ ඇති ආකාරයට රාවණ කෘත්‍යයන් ඉදිරිපත් කර ඇත්තේ කවුරුන් විසින්ද?

නර්තනය

7 ශ්‍රේණිය. 111 - වාරය

ගුරුභවතාගේ නම : ඩබ්ලිව්.ජී. චින්තා පෙරේරා අම්/ සද්ධාතිස්ස මහා විද්‍යාලය

නිපුණතාව :6.0 රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංග වල සුවිශේෂී ලක්ෂණ විචාරයට ලක් කරයි.

නිපුණතා මට්ටම 6.1 - පෙරහැර හා සබැඳි පසුබිම අධ්‍යනය කරමින් සුවිශේෂී ලක්ෂණ විචාරය කරයි.

## කතරගම දේවාල පෙරහැර

කතරගම දේවාල පෙරහැර සිංහල, හින්දු, මුස්ලිම්,ආදිවාසීන් ආදී සියලු ජනයාගේ ආගමික පෙරහැරක් ලෙස හැඳින්වේ. කතරගම දේවාලයේ සාම්ප්‍රධායික වශයෙන් වාර්ෂිකව පැවැත්වෙන ප්‍රධාන මංගල්‍ය උත්සව 03 කි.



- අවුරුදු මංගල්‍ය
- ඇසළ උත්සවය
- ඉල් මහ මංගල්‍ය වශයෙනි.

## කතරගම පෙරහැර පැවැත්වීමේ අරමුණු.

- බැතිමතුන්ගේ අපල උපද්‍රව දුරු කිරීම.
- දේවාශිර්වාදය ලැබීම හා රටට සෙත් පැතීම
- වර්ෂාව හා සශ්‍රීකත්වය ලබා ගැනීමට
- ස්වාභාවික විපත් වලින් රට බේරා ගැනීම

## පෙරහැර පැවැත්වෙන කාලය

කප් සිටුවීමෙන් දින 44 ක් ගෙවුනු තැන දී එළඹෙන අමාවක ගෙවී, පුර පැළවිය දිනයේ දී පුස නැකතින් කතරගම දේවාලයේ පෙරහැර ආරම්භ වේ.

## කතරගම පෙරහැර හා බැඳි චාරිත්‍ර



- ගිනි පෑගීම
- බිම පෙරළීම
- කටු ගැසීම ආදී දුෂ්කර කාර්යයන්හී නියැළෙන්නේ දෙවියන් වෙනුවෙන් ඇඩි භක්තිය ප්‍රකාශ කිරීම සඳහා ය.
- මඟුල් පෙරහැර පැවැත්වෙන දිනයෙහි දී විශේෂ කැවුම්, කිරිබත් සකස් කිරීම චාරිත්‍රයක් වශයෙන් සිදුවන්නකි.
  (මෙම කැවිලි සකස් කරනුයේ දේවාලයේ තේවාකරුවෙකු වන ගම්පහ විදානේ ය.)



- පෙරහැර පටන් ගැනිමේ දී “වත බැඳීම” නම් චාරිත්‍රයක් වේ. වත බැඳීම යනු දේවාභරණ ගෙනයන ඇතුපිට වස්ත්‍ර ඇතිරීම ය.

- කප සිටුවීම

(ඇසළ මාසයේ මංගල්‍ය පැවැත්වෙන මුළු කාලය තුළම කතරගම දෙවියන් මිනිස් ලොවට පැමිණ සිටුවන ලද කපෙහි වාසය කරන බවට විශ්වාසයක් පවතී. එම නිසා සිටුවන ලද කප් පූජා වස්තුවක් ලෙස සලකනු ලැබේ.)



## ගායන හා වාදන අවස්ථා

ඇසළ පුර පසලොස්වක ගොවි අවපැළවිය ලබන දිනයේ දී "වේගවත් පෙරහැර" නමින් හැඳින්වෙන විශේෂ පෙරහැරක් පැවැත්වේ. දුවන පෙරහැර යනු මෙයට තවත් නමකි. මෙම පෙරහැර මහා දේවාලයෙන් නික්ම වල්ලි අම්මා දේවාලය වෙත යයි. මෙහි දී විශේෂ හේවිසි වාදනයක් දැකිය හැකිය. නිලධාරීන් ඉදිරියේ පැවැත්වෙන හේවිසි වාදනයේ දී වාදනය කරනු ලබන්නේ එම අවස්ථාවට පමණක් සැකසුණු බෙර පදයකි. මෙම බෙර පදය නම්කර ඇත්තේ "වීර පදය" නමිනි.

හේවිසි වාදනය මෙන්ම දමිළ බෙරය නාගස්වරම් ආදී භාණ්ඩ වාදනය කිරීම මෙම පෙරහැරේ දැකිය හැකිය. ඊට අමතරව දේශීය වාද්‍ය භාණ්ඩ ද භාවිත කෙරේ.

දෙවියන් වැඩම කිරීම සිදු කරන්නේ මහා දේවාලයෙන් ලබාගත් පිරිත් පැන් දේවාලය පුරා ඉසීමෙන් හා දේවාලය තුළ තැම්පත් කිරීමෙන් අනතුරුවය. එහි දී "හරෝ හරා" නාදයෙනුත් තූර්ය වාදනය, ඝණ්ටා හි සීනු නාදයෙනුත් අවට පරිසරය ගිගුම් දෙයි.

පෙරහැර එළිය කරන පන්දම්කරුවන් ද, සුවඳ දිය හා මල් ඉසින්නන් ද, මාර්ගය පවිත්‍ර කිරීම පිණිස කහ දියර ඉසින්නන් ද, ස්තෝත්‍ර සහ ද්‍රවිඩ ගීතිකා ගායනය කරන්නන් ද පෙරහැර දෙපසින් ගමන් කරනු දැකිය හැකිය.

මෙහි දී සිංහල හා ද්‍රවිඩ ජනතාවගේ එකමුතුකම ද පෙනේ. මෙහි දිස් වන්නේ රජ පෙරහැරක ස්වරූපයකි. ඊට හේතුව රජ පෙරහැරක ඇතුළත් වූ සෑම අංශයක්ම මෙම දේවාල පෙරහැරෙහි අන්තර්ගතව තිබීම ය.

## නර්තන රංග වස්ත්‍ර හා සැරසිලි

පෙරහැරහි වැඩම කරවනු ලබන ශුද්ධ වස්තු, යන්ත්‍ර හා දේව රූප, වාසනාමේදිය වෙත ගෙන යනුයේ කපුරාල ය. දේවාලයේ සිට මෙදිය තෙක් වූ මාර්ගය රතු පලසක් වැනි පාවඩයකින් සහ සුදු වියනකින් සැරසීමත්, ශුද්ධ වස්තූන්ගෙන් යන කපුරාල මුඛවාඩමකින් හා තලප්පාවකින් සැරසීමත්, මේ අවස්ථාවේ දී දැකගත හැකිය.



අලි ඇතුන්ගෙන් මෙන්ම විදුලි බුබුළු වලින් හා වීදි සැරසිලි වලින් පෙරහැර අලංකාර වෙයි.

පෙරහැරේ ඉදිරියෙන්ම සිටින්නේ ඉර හඳ නිරූපනය කෙරෙන සිංහල පත්‍ර, සේසත් දරන්නන් හා දිසා කොඩි දරන්නෝය. පෞරාණික නියමයන් අනුව තම තමන්ට නියමිත කොඩි ඔසවාගත යුත්තේ නින්දගම් ලද්දවුන් විසිනි.

ඊළඟට නිළමේ ඇඳුමෙන් සැරසුනු බස්නායක නිලමේ සහ දේවාලයේ ලේකම්වරයා දැකිය හැකිය. ඔවුන් දෙදෙනා දෙපස කපුරු හා පහන් අතැති හේවා කරුවෝ දෙදෙනෙක් සිටිති. දෙවියන් වැඩමවන ඇතුපිට මුඛවාඩමින් සැරසුණු කපුරාලය. දෙවියන්ගේ ආරක්ෂාවට මෙන් එසේ ගමන් කරනුයේ මහ දේවාලයෙහි සේවාව කරන ප්‍රධාන කපුරාළයි. ඇතු පිටුපසින් අත්වැල් බැඳගත් ආලත්ති අම්මලා ගමන් කරති.

## නර්තන අංග

- උඩරට, පහතරට හා සබරගමු ආදී සාම්ප්‍රධායික නර්තන අංග මෙන්ම
- කුලු, ගොයම්
- රබන්, සවරම්
- චාමර, වේවැල්
- තාලම්, ලී
- කඩු ආදී විවිධ ගැමි නැටුම් වලින් ද
- සිංහ නැටුම
- හනුමන්තා නැටුම
- මොනර නැටුම ආදී නිර්මාණ නැටුම් වලින් මෙම පෙරහැර අලංකාරවත් වේ.
- ද්‍රවිඩ සංස්කෘතිය හා බැඳි කාවඩි නැටුම, කොහොඹ කළය ආදී නැටුම් මෙම පෙරහැරෙහි සුවිශේෂ වේ.









- කතරගම පෙරහැර දිය කැපීමේ මංගල්‍යයෙන් අවසන් වේ.



<u>කාර්ය පත්‍රිකාව</u>

➢ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. කතරගම පෙරහැර පවත්වනු ලබන්නේ කප් සිටුවීමෙන් දින කියකට පසුව ද?

   1. 50 කට පසු  2. 44 කට පසු  3. 30 කට පසු  4. 21 කට පසු

02. කතරගම පෙරහැරේ දැකිය හැකි විශේෂ චාරිත්‍රයකි,

   1. දිය පැගිම  2. මිල්ල කැපීම  3. ගිනි පෑගීම  4. ගස් පේ කිරීම

03. පෙරහැර ආරම්භ කිරීමේ දී සිදු කරනු ලබන ප්‍රධාන චාරිත්‍රයකි,

   1. වත බැඳිම  2. රන් බැඳීම  3. නූල් බැඳිම  4. මාල බැඳීම

04. කතරගම පෙරහැර නිමා කරනු ලබන්නේ,

   1. නානුමුර මංගල්‍යයනි 2. ගිනි පෑගීමෙනි 3. දිය කැපීමේ මංගල්‍යයනි 4. කටු ගැසීමෙනි

05. දෙවියන් වෙනුවෙන් දැඩි භක්තිය ප්‍රකාශ කිරීමේ අංගයක් වන්නේ,

   1. කටු ගැසීම  2. වත බැඳීම  3. නූල් බැඳීම  4. පොල් ගැසීම

➢ නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.

| | |
|---|---|
| 06. හේවිසි වාදනයේදී වාදනය කරන පදයකි | නාගස්වරම් |
| 07. ද්‍රවිඩ නැටුමකි | ආලත්ති අම්මාවරු |
| 08. ඇතු පිටුපසින් අත්වැල් බැද ගමන් කරනු ලබන්නේ | දුවන පෙරහැර |
| 09. ද්‍රවිඩ වාද්‍යභාණ්ඩයකි | වීර පදය |
| 10. වේගවත් පෙරහැර යනු | කොහොඹ කලේ |

➢ කෙටි පිළිතුරු සපයන්න.

01. කතරගම පෙරහැර පැවතීමේ අරමුණු 04 ක් ලියා දක්වන්න.

02. පෙරහැර හා සම්බන්ධ සුවිශේෂී චාරිත්‍ර විධි 03 ක් නම් කරන්න.

03. කතරගම දේවාලයේ සාම්ප්‍රදායික වශයෙන් වාර්ෂිකව පැවැත්වෙන ප්‍රධාන මංගල්‍ය උත්සව 03 ක් නම් කරන්න.

04. ද්‍රවිඩ වාද්‍ය භාණ්ඩ 2 ක් නම් කරන්න.

05. කතරගම පෙරහැරේ දැකිය හැකි නර්තන අංග 5 ක් නම් කරන්න.

නර්තනය

7 ශ්‍රේණිය. 111 - වාරය

ගුරුභවතාගේ නම : Y.G.U.S. රාජපක්ෂ අම්/සද්ධාතිස්ස මහා විද්‍යාලය

නිපුණතාව: 6.0 රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංග වල සුවිශේෂී ලක්ෂණ විචාරයට ලක් කරයි.

නිපුණතා මට්ටම : 6.2 වෙනත් සංස්කෘතික වලට අයත් නර්තන අංගවල සුවිශේෂී ලක්ෂණ ඉදිරිපත් කරයි.

## කරගම් / කාවඩි නර්තන අංග හඳුනා ගනිමු

6 ශ්‍රේණියේ දී උගත් සිංහල, ද්‍රවිඩ ජන නැටුම් පිළිබඳ දැනුම, අවබෝධය සමගින් කරගම්, කාවඩි නර්තන අංග පිළිබඳව අධ්‍යයනය කරමු.

### කරගම්

- ✳ කරහම් / කරගම් / කර්නාට්ටම් යනුවෙන් හඳුන්වනු ලබයි.
- ✳ තමිල්නාඩු ප්‍රදේශයේ ප්‍රභවය ලබා දී ඇත.
- ✳ තාන්ජාවූර් ප්‍රදේශයේ ආගමික පුද පූජා අවස්ථාහිදී දක්නට ලැබේ.
- ✳ කාලි, අයියනාර්, මුරුගන්, දෙවිවරුද ද්‍රවිඩ ජනයා හඳුන්වන කන්නගී ( පත්තිනි දේවිය) සහ මාරි අම්මාන් යන දෙවිවරු පූජාවට පාත්‍ර වේ.
- ✳ අගෝස්තු මාසය පුරාවට පවත්වන පුද පූජා වලදී ඉන්දියාවේ සහ ලංකාවේ දී මෙම නර්තන දැකගත හැකිය.
- ✳ ස්ත්‍රී - පුරුෂ දෙපාර්ශවයම නර්තනයේ යෙදේ.



### පැවැත්වීමේ අරමුණු

- ★ දේව භක්තිය ප්‍රකාශ කිරීම.
- ★ දේව ආශිර්වාදය ලබා ගැනීම.
- ★ නියඟ වලක්වා වර්ශාව ලබා ගැනීම.
- ★ දෙවියන්ගේ ලෙඩ ලෙස හඳුන්වන පැපොල, සරම්ප, වසූරිය, ආදි ලෙඩ රෝග වළක්වා ගැනීම හා ආරක්ෂාව පතා



### කරගම් නර්තනයේ සුවිශේෂී ලක්ෂණ,

- ✳ කළ ගෙඩි කිහිපයක් එක මත තබා සමබර කරගනිමින් නර්තනය කරයි.
- ✳ කළය හිස මත තබා සාරිය බිම එලා එය මත පෙරලෙමින් සාරිය ඇඳ ගැනීම හා ගැලවීම.



* මාරි අම්මාන් පුද ලබන අවස්ථාවේදී ගිණි බඳුනක් හිස තබා හෝ අතින් තබා ගනිමින් නර්තනය කරයි. එය " ශක්ති කරගම්" වේ.
* සරල චලන යොදා ගනිමින් කළ හිස මත තබා ගනිමින් නර්තනය කිරීම.
* තනිව හෝ යුගල වශයෙන් කාන්තා, පිරිමි භේදයකින් තොරව නර්තනය කිරීම.
* කළයේ සමබරතාව රඳවා ගැනීමට කළයට සහල් දමයි.
* අලංකාරය සඳහා කහ, රතු, මල් වැඩි වශයෙන් යොදා ගැනීම, කළ මුදුනේ කඩදාසි වලින් කල ගිරවෙක් යොදා ගැනීම.

## සංගීතය භාණ්ඩ හා රංග වස්ත්‍රාභරණ

* නෛයාණ්ඩි, මේලම්, බෙර වර්ග, බටනලා, ආදී වාද්‍ය භාණ්ඩ යොදා ගැනේ. වර්තමානයේ ගීත වල අනුවාදය යොදා ගැනේ.
* දිය සාය හැට්ට හා සාරිය කාන්තාවන් විසින් ඇඳ නොයෙක් ආභරණ පළඳී.
* පිරිමින් ජෝතිය (යටිකයට) හා උඩුකය නග්න වේ. පුන නූල පලඳී.

## කාවාඩි



* දක්ෂිණ භාරතිය නිජබිම කර ව්‍යාප්ත වී ඇත.
* භාරතීය ජනයා "කාවාඩි ආට්ටම්" ලෙස හඳුන්වයි.
* මුරුගන් හෙවත් ස්කන්ද කුමාර දෙවියන් පුද ලබයි.
* අගෝස්තු මාසය පුරා මෙම නර්තනය දක්නට ලැබේ.

## පැවැත්වීමේ අරමුණු



* පූජාර්ථය අරමුණු කොට ගෙන නර්තනය කරයි.
* වර්තමානයේ විනෝදාස්වාදය උදෙසා නර්තනය කරයි.
* කතරගම දෙවියන්ට භාර ඔප්පු කිරීම සඳහා පවත්වයි.
* ඇතැම් දේවාල වල දිනපතා පවත්වනු ලබයි. උදා: රුහුණු කතරගම දේවාලය

## කාවඩි නර්තනයේ සුවිශේෂි ලක්ෂණ,

* කාවඩිය සමබරව උරහිස මත තබා නර්තනය කිරීම.
* කාවඩිය හිස මත සමබරව තබාගෙන වේගයෙන් කැරකීම සුවිශේෂි දක්ෂතාවයකි.
* කාවඩිය නර්තනයේ දී ඒකල, සාමූහිකව හෝ කුමන ආකාරයෙන් වුවද නර්තනය කළ හැකි වීම.
* වයස් භේදයකින් තොරව නර්තනය කල හැකි වීම.



- මෙයට අමතරව විවිධ කාවඩි වර්ග දක්නට ලැබේ.
  * පාල් කාවඩි
  * සන්දන කාවඩි
  * පුෂ්ප කාවඩි
  * පැන්නීර් කාවඩි
  * තුතු කාවඩි

එසේම කතරගම දේවාලය ආශ්‍රිතව ඇති කාවඩි වර්ග කිහිපයක් ගැනද ඇතැම් පොත් වල සඳහන් කර ඇත.

- ✳ පරෙවි කාවඩි
- ✳ භක්ති කාවඩි
- ✳ ගිණි කාවඩි
- ✳ කිරි කාවඩි ( අද්‍යතනයේ භාවිතයේ පවතී)

## රංග වස්ත්‍රාභරණ හා වාද්‍ය භාණ්ඩ

- ✳ පුරුෂයින් සඳහා යටි කයට ජෝතියද, උඩුකය නග්නවද දක්නට ලැබේ.උඩුකයට පූන නූල පලඳිනු ලැබේ.
- ✳ කාන්තාවන් විචිත්‍රවත් සාරි ඇඳ, කාන්තා ආභරණ පලඳී.

## සංගීතය

කාව්‍ය මෙවලම් හා නෛයාණ්ඩි මේපම් වාද්‍ය භාණ්ඩ වශයෙන්ද යොදාගනී. වර්තමානයේ ගීත වල අනුවාදනයට අනුව නර්තනය කරයි.

## කාර්ය පත්‍රිකාව

➢ නිවැරදි පිළිතුර තෝරා යාකරන්න.

| | |
|---|---|
| (1) දක්ෂිණ භාරතයේ ප්‍රචලිතය | ★ භාරතීය ද්‍රවිඩ ජනයා |
| (2) අයියනාර් දෙවියන් පුදලබයි. | ★ මාරි අම්මාන් දෙවියන් |
| (3) ශක්ති කරගම් නර්තනය | ★ කාවඩි |
| (4) කාවඩි ආට්ටම් නර්තනය | ★ කතරගම දෙවියන් |
| (5) ස්කන්ද කුමාර දෙවියන් | ★ කරගම් |

➢ පහත සඳහන් වාක්‍ය කියවා හරි නම් (✓) ලකුණද, වැරදි නම් (×) ලකුණද යොදන්න.

1. කලය සමබරව තබා ගැනීමට කළයට සහල් දමනු ලබයි. ( )
2. තාන්ජාවූර් ප්‍රදේශයේ ප්‍රභවය ලබා ඇති නර්තනය කාව්‍ය නම් වේ. ( )
3. පරෙවි කාවඩි යනු කතරගම දේවාලයට අයත් කාවඩි වර්ගයකි. ( )
4. මුරුගන් හෙවත් ස්කන්ද දෙවියන් පුද ලබන්නේ කරගම් නර්තනයේදීය. ( )
5. කරගම්, කාවඩි පුරුෂයින් විසින් පමණක්ම නර්තනය කරනු ලබයි. ( )

➢ පහත දැක්වෙන ප්‍රශ්න සඳහා පිලිතුරු සපයන්න.

01. කරගම් නර්තන අංගය පැවැත්වීමේ අරමුණු ලියන්න.
02. කාවඩි නර්තනයේ දී දැකිය හැකි සුවිශේෂතා නම් කරන්න.
03. කරගම් හා කාවඩි නර්තනයන්හි රංග වස්ත්‍රාභරණ හා වාද්‍ය භාණ්ඩ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
04. කරගම් නර්තනය පිළිබඳ අදහස් දක්වන්න.
05. කරගම් / කාවඩි නර්තන අංග දක්නට ලැබෙන අවස්ථා නම් කරන්න.

නර්තනය

7 ශ්‍රේණිය. 111 - වාරය

ගුරුභවතාගේ නම : ඩී.ඩී. සරෝජනී පුෂ්පලතා අම්/බණ්ඩාරණායක බා.ජා.පා.

නිපුණතාව : 7.0 විවිධ අත්දැකීම් ඇසුරු කර ගනිමින් කලාංග නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම : 7.1 නිර්දේශිත ගීතයට සවන් දී සුවිශේෂතා සාකච්ඡා කරමින් අදහස් ඉදිරිපත් කරයි.

## ගීතයක සැබෑ සුන්දරත්වය රස විඳිමින් ප්‍රාසාංගිකව නර්තනය නිර්මාණය කිරීම.

### අද වෙස්සන්තර රාජ පුතා...

මෙම ගීතය නීතිඥ ජෝන් ද සිල්වා මහතාගේ වෙස්සන්තර ජාතකය නම් වූ නූර්තියෙන් උපුටා ගන්නා ලද්දකි.

අද වෙස්සන්තර රාජ පුතා
මන්ද්‍රි කුමාරි බඳී
දේවෝපකාර වෙවා සැදී සෙත්
අද වෙස්සන්තර රාජ පුතා
මන්ද්‍රි කුමාරි බඳී
දේවෝපකාර වෙවා සැදී සෙත්

රටවැස්සන්ගේ කාලෙ සොඳා
දුර්භික්ෂ යාය සිඳී
මංගල්ලෙ සාර වෙවා සැදී සෙත්
රටවැස්සන්ගේ කාලෙ සොඳා
දුර්භික්ෂ යාය සිඳී
මංගල්ලෙ සාර වෙවා සැදී සෙත්

බොහොම ප්‍රීතිඝෝෂා ඇසෙන්නා මේ සිව්දිසා//
සෙත අත්පත් වේවා මන්ද්‍රි කුමරි හට දැන්//
රාජ සම්පත් නොමින් දේය රාජා උතුම්//
කුමරාගෙ පිනක් මැයී..
වාසනාවෝ..වාසනාවෝ..

ගීතයේ පද රචනය. - ජෝන් ද සිල්වා මහතා

ගායනය - ජෝන් ද සිල්වා නාට්‍ය කණ්ඩායම

ගීතය ඇතුළත් නාට්‍ය - වෙස්සන්තර ජාතකය

## වෙසක් කැකුළු......

අතිශයින් සුන්දර පද රචනයකි. පරිසර සුන්දරත්වය පිළිබඳ අපූර්ව දෘෂ්ටිකෝණයකින් බලන ගී පද රචකයා පරිසරයේ සිදුවන ස්වභාවික සංසිද්ධීන් සරල බසින් විස්තර කරයි.

වෙසක් කැකුළු අතු අග ඉඳ නටන විලාසේ
ඉරෙත් හඳෙත් සිරි විඳ විඳ රඟන විලාසේ

පියලි සලාලා රේණු හලාලා
සුවඳ උරා සිසිල් සුලං හමන්නේ
ලොවම අවදිවෙමින් අමුතු
පණක් ලබන්නේ

දවට ගහේ ගහ මුදුනේ කොහා අඬන්නේ
කෑරලාද නාද දෙමින් ගහට කොටන්නේ

ටිං ටිං සද්දේ ඒ මැද ඇත්තේ
ගම වටකර කුරුලු ගීත ඇසෙන්නේ
ලොවම අවදිවෙමින් අමුතු
පණක් ලබන්නේ

කඳා වලලු දෑත දිගේ ටිකිරිලියන්ගේ
ටිකිරි ටිකිරි වලලු හඬයි ළපටි ළඳුන්ගේ

ගීත ගයන්නේ ගයා නටන්නේ
කොළු කෙලි පොඩි ගී ගයමින් නටන්නේ
ලොවම අවදිවෙමින් අමුතු
පණක් ලබන්නේ

ගායනය ඉන්ද්‍රාණී සේනාරත්න
රචනය මර්සලින් ජයකොඩි පියනම
වාදනය සුනිල් සාන්ත (c)2000-05, www.sinhalajukebox.org




- දුවේ පුතේ මෙම ගීතය CD/ DVD පට උපයෝගී කරගනිමින් ගීත ශ්‍රවණය කරන්න.
- ගීතයන්හි තාලය නාද මාලාව පිළිබඳ අවධානය යොමු කරමින් ගීතය කිහිප වරක් ගායනා කරන්න.
- ගීතයන්හි පසුබිම විස්තර කිරීමට යොමුවන්න.

## කාර්ය පත්‍රිකාව

1. “වෙසක් කැකුලු” ගීතය ගායනා කරනු ලබන්නේ කවුරුන්ද?
2. “වෙසක් කැකුලු” ගීතයේ පද රචනය කරනු ලැබුවේ කවුරුන්ද?
3. “වෙසක් කැකුළු” ගීතයේ සංගීතය නිර්මාණය කළේ කවුද?
4. “වෙසක් කැකුළු” ගීතයේ ඔබ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.
5. “වෙසක් කැකුලු” ගීතයට සුදුසු වන අයුරින් චලන යොදා ගනිමින් නර්තනය නිර්මාණය කරන්න.
6. “අද වෙස්සන්තර රාජ පුතා” ගීතය ඇතුලත් නාට්‍ය කුමක්ද?
7. “අද වෙස්සන්තර රාජ පුතා” ගීතය පද රචනය කළේ කවුද?
8. “අද වෙස්සන්තර රාජ පුතා” ගීතය ගායනය කරනු ලබන්නේ කවුද?
9. ගීතයට අනුව නර්තන නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න.
10. “අද වෙස්සන්තර රාජ පුතා” ගීතය ගායනා කරන්න.